

අධ්‍යයන ගොනුව
කළුමාලි
වැඩිහිටියන්ට සුරංගනා කතාවක්
stages
theatre
group

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයාගේ ලිඛිත අවසරයෙන් තොරව මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් නැවත සකස් කිරීම හෝ වෙනත් පිටකවරයකින් පළ කිරීම හෝ ප්‍රකාශයට පත් කර ඇති තත්වයෙන් හෝ තත්වයට වඩා වෙනස් ආකාරයකින් ප්‍රකාශයට පත් කිරීම හෝ සපුරා තහනම්.

**අධ්‍යයන ගොනුව**

**කලුමාලි : වැඩිහිටියන්ට සුරංගනා කතාවක්**

පළමු ප්‍රකාශනය (අන්තර්ජාල/ e - ප්‍රකාශන) 2020
© 2020 ස්ටේජස් නාට්‍ය කණ්ඩායම
ISBN 978-624-5487-43-1

**කලුමාලි**
*වැඩිහිටියන්ට සුරංගනා කතාවක්*

රචනය - නදී කම්මැල්ලවීර සහ රුවන්ති ද චිකේරා

Stages Theatre Group නිෂ්පාදනයක්
රුවන්ති ද චිකේරා ගේ අධ්‍යක්ෂණය

සැප්තැම්බර්, 2012
ලයනල් වෙන්ඩ්ට් රඟහල, ශ්‍රී ලංකාව

*කවරයේ ඡායාරූපය:*
*කලුමාලි දෙවියන් යදියි*
මල්ෂානි දෙල්ගහපිටිය
ඡායාරූපය - චානුක තියඹරාවත්ත

*අනිත් පැත්ත:*
*කුඹිච්චි කලුමාලි පුහුණුවෙමින්*
ජයම්පති ගුරුගේ
ඡායාරූපය - පසන් රණවීර



***කළුමාලි - වැඩිහිටියන්ට සුරංගනා කතාවක්*** කියන්නේ ස්ටේජස් නාට්‍ය කණ්ඩායම විසින් ඩිවයිසින් ක්‍රමවේදය විධිමත්ව සහ පුළුල්ව භාවිත කරමින් කළ පළමුවෙනි නිර්මාණය. ඇත්තටම ස්ටේජස් කණ්ඩායම කළුමාලි නිර්මාණයට අත ගහන කොට ඔවුන් 'ඩිවයිසින්' කියන වචනෙ පවා අහලා තිබුණේ නැහැ. ඔවුන් කළේ අවුරුදු එකහමාරකට පෙර රංගන ශිල්පින් 13 දෙනෙක් විසින් මාතෘත්වය සම්බන්ධ තමන්ගේ අත්දැකීම් විමසා බලමින් ඒවා විවිධාකාරයට ලියා තබමින් ආරම්භ කළ ක්‍රියාවලියට (Passing Stage ව්‍යාපෘතිය). නිසඟයෙන් පැන නගින  ප්‍රතිචාර දක්වමින් එය ඉදිරියට ගෙන යාමයි.

කළුමාලි කියන්නේ  මවක් ලෙස තමන් මත පැවරුණු වගකීම් සහ ජීවිතය සහ ලෝකය පිළිබඳ තමන්ගේ පෞද්ගලික විශ්වාසයන් අතර අනවරත ඝට්ටනයකට මුහුණ දෙන තරුණ කාන්තාවකගේ කතාන්දරය ඇසුරින්  නූතන සමාජයේ දරුවන් හැදීමේ උභතෝකෝටික අභියෝගය පිළිබඳව කතා කරන, Passing Stage අත්පිටපත තුළින් නිර්මිත ප්‍රධාන නිර්මාණයයි.

කළුමාලි කියන්නේ ස්ටේජස් නාට්‍ය කණ්ඩායමට තීරණාත්මක නිෂ්පාදනයක්. එය වසර කිහිපයක විරාමයකින් පසු  ශ්‍රී ලාංකීය වේදිකාවට ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ සක්‍රීය ආපසු පැමිණීම සනිටුහන් කළා. එසේම ද්විභාෂික ඩිවයිසින් නාට්‍ය සමාගමක් හැටියට එහි අනන්‍යතාවත් ශක්තිමත්ව තහවුරු කළා. කළුමාලි නාට්‍යයට පසු ස්ටේජස් නාට්‍ය කණ්ඩායම කළ සෑම නිෂ්පාදනයකදීම ඩිවයිසින් නාට්‍ය වෘන්දයක් හැටියට සිය අනන්‍යතාව තවදුරටත් ශක්තිමත් කර ගත් අතර, ක්‍රියාකාරී ද්විභාෂික නාට්‍ය සමාගමක් හැටියටත් එහි ශක්‍යතාවත් වැඩි වර්ධනය කරගත්තා.

මේ අධ්‍යයන ගොනුව කළුමාලි නාට්‍ය නිර්මාණය කිරීම දක්වා වූ ගමනේ ඇතැම් පැතිකඩ කිහිපයක් තුළින් ඔබව කැඳවාගෙන යාවි. මේ ගමන එකට එක්ව දරුවෙක්ව හදන්නට උත්සහ දරන අලුත් දෙමාපියන් යුවළකගේ ගමනට වඩා වෙනස් නැති බව ඔබට වැටහේවි.



අධ්‍යක්ෂකගේ නිවසේදී
මූලික සැලසුම් සහ
සංකල්ප සාකච්ඡා
කරමින්,
ස්ටේජස් නාට්‍ය
කණ්ඩායම

පිවිතුරුම සිතුවිලි හදවතේ දරාගෙන, හැකි උපරිමයෙන් අවංකවෙමින්, නමුත් ඇත්තටම කළ යුත්තේ මොනවාදැයි පැහැදිලි ඉඟියකින් තොරව ගිය ගමනක් ඒක.
කලුමාලි බිහිවුණේ, ඉව, වෙහෙස වී වැඩ කිරීම, අත්හදා බැලීමට ඇති කැමැත්ත සහ කලා ශිල්පීන්ගේ නොමඳ කැප වීම යන සියල්ලේ එකතුවෙන්. නිෂ්පාදනය අවසානයේදී, අලුත් නාට්‍යයකට වඩා  බොහෝ දේවල් අපට ලැබී තිබුණා. අලුත් කණ්ඩායමක්, වැඩ කිරීමේ අලුත් විදියක් සහ අප අබියස දිග ඇරුණු අලුත් පාරක්.....



# පටුන


**කවුද කලුමාලි කියෙන්නේ?** 11

**කලුමාලි ඉපදුණේ කොහොමද?** 15

**කලුමාලි ලොකු මහත් කරගත්තේ කොහොමද?** 19

- කලුමාලි නිර්මාණය කළේ අත්හදා බැලීම් හරහා 19
- කලුමාලි නිර්මාණය කළේ ඝට්ටනයන් හරහා 22
  - කලුමාලි තුළම ඝට්ටනයන් 23
  - කලුමාලිගේ පවුල තුළ ඝට්ටනයන් 34
- කලුමාලි නිර්මාණය කළේ සැබෑ ජීවන ආදර්ශයන් හරහා 60

**කලුමාලි හි වර්ණ, ආලෝකකරණය සහ සංගීතය** 71

**කලුමාලි තබා ගිය පිය සටහන්** 85


*නාඳුනන මිනිසාගේ කලුමාලි*

ජුවනීටා බීලිං සහ වේදිකා

සහයකයින්

ඡායාරූපය - චානුක තියඹරාවත්ත



# කවුද කලුමාලි කියන්නේ?

කලුමාලි කියන්නේ නිදි මරගාතෙන් ආපු සුරංගනාවියන්
දෙන්නෙක් අතින් වෙච්ච විසාල අත්වැරැද්දක ප්‍රතිඵලයක්
විදියට ඉපදුණු ගෑනු බබෙක්.

කලුමාලි කියන්නේ සුරංගනාවියන් දීපු වැරදි තෑගි වලින්
වෙච්ච අවුල මැද්දෙ තමන්ගේ අනන්‍යතාව සොයාගන්න විශාල
අරගලයක් කරන්න සිද්ද වෙච්ච ගෑනු ළමයෙක්.

කලුමාලි කියන්නේ තමන්ට ලැබුණු වැරදි තෑගි වලින් මැජික්
මවන්න පුළුවන් කියලා හොයාගත්තු වැඩුණු ගෑනු කෙනෙක්.

එදා ඉඳල කලුමාලිට කරන්න බැරි කිසිම දෙයක්......
කිසිම දෙයක් තිබුණෙ නෑ......

*කලුමාලි ඉපදුනා*
මල්ෂානි දෙල්ගහපිටිය
ඡායාරූපය - පසන් රණවීර

කලුමාලි කියන්නේ අද දවසේ මාතෘත්වය හා බැඳුණු සංස්කෘතික සහ සමාජ අපේක්ෂාවන් එක්ක අරගල කරන අම්මා කෙනෙක් ගැන නාට්‍යයක්.

කලුමාලි හැදිලා තියෙන්නේ සකී කියන අවුරුදු 8 ක ගෑනු ළමයෙකුට කියන සුරංගනා කතා 5 කින්.

කලුමාලි කියන්නේ ළමයින්ට සහ වැඩිහිටියන්ට එකට බලන්න පුළුවන් නාට්‍යයක්. හැබැයි සමහරවිට ඒ දෙගොල්ලො දෙවිදියකට තේරුම් ගන්න ඉඩ තියෙන නාට්‍යයක්.

කලුමාලි කියන්නේ මව්වරුන් වූ කලාකාරිනියන් 13 දෙනෙක් අවුරුදු එකහමාරක් පුරා මව් පදවිය සම්බන්ධ තමන්ගේ අත්දැකීම් ලියා තැබූ අත්පිටපතක් ඇසුරින් බිහිවුණු නිර්මාණයක්.

කලුමාලි කියන්නේ ඩිවයිසින් ක්‍රමවේදය යොදාගෙන නිර්මාණය කළ නාට්‍යයක්. පිටපත සහ රංගය නිර්මාණය කළේ රංගන ශිල්පීන්, පිටපත් රචකයන් සහ වේදිකා සැලසුම් නිර්මාණ ශිල්පීන් ගේ සාමූහික දායකත්වයෙන්.

කලුමාලි කියන්නේ පැය එකහමාරක් දිග නාට්‍යයක්. එය මුල්වරට නළු නිළියන් 11 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ප්‍රොසීනියම් වේදිකාවේ රංග ගත කරා.

කලුමාලි ඉංග්‍රීසි සහ සිංහල භාෂා දෙකින්ම රංග ගත කෙරුණා. එකම නළු නිළි කණ්ඩායම නිෂ්පාදන දෙකේම රඟපෑවා. සමහර අය නිෂ්පාදන දෙකේ වෙනස් චරිත නිරූපණය කළා.

කලුමාලි මුල්වරට විදිකාගත කළේ 2012 සැප්තැම්බර් මාසයේ, ශ්‍රී ලංකාවේ ලයනල් වෙන්ඩ්ට් රඟහලේදී. මේ මංගල දර්ශනයට පසුව කලුමාලි කිහිප වරක් කොළඹ රංග ගත කෙරුණා.

කලුමාලි විවෘත විශ්ව විද්‍යාලයේ සාහිත්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා නිර්දේශිත කෘතියක්. එය 2012 වසරේදී, ග්‍රේෂන් ත්‍යාගය සඳහා අවසාන නිර්මාණ 5 අතරට  තේරුණා.


කලුමාලිට මැජික් කරන්න පුළුවන්
මල්ෂානි දෙල්ගහපිටිය
ඡායාරූපය - චානුක තියඹරාවත්ත

කලුමාලි කියන්නේ වැඩිහිටියන් උදෙසා වූ සුරංගනා කතාවක් - මැජික් සහ
සිහින ළමා වියට පමණක් අයිති දේවල් නොවිය යුතු නිසා.....



# කලුමාලි ඉපදුණේ කොහොමද?

**කලුමාලි සැලසුම් කරපු ගැබ් ගැනීමක් නෙමේ....**

**තනි පිටුවක කුඩා කතාන්දරයක සිට පූර්ණ නාට්‍ය නිෂ්පාදනයකට පාදක වූ සංකල්පයක් දක්වා කලුමාලි ගිය ගමන කොයි වගේද කියලා අපි මේ කොටසින් විමසා බලනවා.**

කලුමාලි කියන්නේ ලංකාවේ මව්වරුන් වූ කලා ශිල්පිනියන් 13 දෙනෙක් අවුරුදු එකහමාරක් පුරා කළ රචනා ක්‍රියාවලියක අවසාන ප්‍රතිඵලය. මේ ලිවීමේ ක්‍රියාවලිය පටන් ගත්තේ, 2010 දී. නාට්‍ය ශිල්පිනියන් දෙදෙනෙකු වූ රුවන්ති ද චිකේරා සහ නදී කම්මැල්ලවීර තවත් කලාකාරිනියන් කණ්ඩායමක් එක් කරගෙන මේ ව්‍යාපෘතිය ආරම්භ කළා. කලාකාරිනියන් 13 දෙනෙක්, අම්මා කෙනෙක් වීමේ තමන්ගේ අත්දැකීම පදනම් කරගෙන විවිධාකාරයේ රචනා අභ්‍යාස වල නිරත වුණා. මේ ක්‍රියාවලිය අවසානයේ පිටු 300 ක Passing Stage නම් වූ ද්විභාෂික අත්පිටපතක් බිහි වී තිබුණා.

**එක් රචිකාවියක් Passing Stage අත්පිටපතට තමන් ගැනම සුරංගනා කතාවක් හැටියට කලුමාලි නමින් ලියා තිබූ කුඩා කතාන්දරයක කලුමාලි නාට්‍යයේ බීජ සැගවී තිබුණා. මාස ගාණක් තිස්සේ කලුමාලි අත්පිටපතේ ඇය හැංගී සිටියා. ඇය එක්ක මොනවා කරන්නද කියා කවුරුත් හරියටම දැනගෙන සිටියේ නැහැ. නමුත් ඇය එතන සිටින බව කාටවත් අමතක කරන්නට පුළුවන් වුණේත් නැහැ.**

**කලුමාලි බිහිවෙන්න යන්නේ, මාතෘත්වය පූජනීයත්වයෙන් සලකන, මව්වරුන් වනාහි සිය පවුල වෙනුවෙන් අසීමාන්තිකව කැප කිරීම් කිරීමට ශක්‍යතාව දරා සිටිය යුතු උත්තරීතර මනුෂ්‍ය කොට්ඨාශයක් විය යුතු බව පිළිගන්නා රටක. මේ නිසා කලුමාලි**

*නාට්‍යයේ ආරම්භක ජවනිකාව සඳහා වන පසුතලය. පෙර පාසල් පුටු පෙළක සෙල්ලම් බඩු මැද දිල් වාඩිවෙයි.*
ඡායාරූපය - ශ්‍යාමල් මුතුමුදලිගේ

තුළ අන්තර්ගත වෙන  මාතෘත්වය සම්බන්ධ උභතෝකෝටික, අපහසුතාව දනවන, අභියෝගාත්මක සහ පැටලිලි සහිත අත්දැකීම් ප්‍රේක්ෂාගාරය කළඹවනු ඇති කියාත්, ඔවුන් එය ප්‍රතික්ෂේප කරනු ඇති කියාත් සාධාරණ බයක්, සැකයක් අප තුළ තිබුණා.

ගර්භය තුළ මෝරන අවධියේදී කලුමාලිගේ වර්ධනය සම්බන්ධයෙන් වගකීම දැරූ කලාකරුවන් කණ්ඩායම සෑම තීරණයක් සම්බන්ධයෙන්ම අසීමාන්තිකව කැළඹුණා. නැවත නැවතත් Passing Stage අත්පිටපත කියෙව්වා. රෑ එළිවෙන තුරු, කල්පනා කළා. සාකච්ඡා පැවැත්වුවා.වැඩි පිරිසකගේ පිළිගැනීමට ලක් වෙන ආකාරයේ පරිපූර්ණ අදහසක් හැටියට කලුමාලි ඉපැද්දවීමේ අරමුණින් ඔවුන් හැකි තරම් කලුමාලි බීජය පෝෂණය කරන්නට වෙහෙස ගත්තා.

හැමෝම තැති ගැන්මෙන් යුතුව, නොඉවසිල්ලෙන් බලා සිටියා.

ඔන්න, කලුමාලි ඉපදුණා.

අවසානයේ, රුවන්ති සහ නදී සමඟ එක්ව වැඩ කළ කුඩා කණ්ඩායමට ඇගේ හැඩය සහ ව්‍යුහය පැහැදිලිව දකින්නට පුළුවන් වුණා. තවමත් තනිව නැගී සිටීමට ශක්තියක් නැති දුර්වල තත්ත්වයක සිටියා වුවත් තමන්ටම ආවේණික සුවිශේෂී අනන්‍යතාවක් සහ තමන්ගේ ඉරණම පිළිබඳ තීව්‍ර සංජානනයක් ඇය සතුව තිබුණා.

පුහුණුවීම් කාමරයේ දොරවල් වසා, සිය  විභවය උපරිමයෙන් සාක්ෂාත් කර ගත හැකි මට්ටමකට ඇයව ගොඩ නැගීම ආරම්භ කිරීමට - එනම් ප්‍රබල නාට්‍යයක් දක්වා ඇය වර්ධනය කිරීම ඇරඹීමට - කාලය එළඹ තිබුණා.

*දිල්ගේ කලුමාලි දම්පාට කන්ද*
*නගින්න බලාගෙන සිටියි.*
නදී කම්මැල්ලවීර
ඡායාරූපය - චානුක තියඹරාවත්ත





# කලුමාලි ලොකු මහත් කරගත්තේ කොහොමද?

කලුමාලිව ලොකු මහත් කරගත්තෙත් ළමයෙක් හදන විදියටම තමයි. ඒ කියන්නේ අත්හදා බැලීම් බොහොමයක්, ගැටුම් බොහොමයක් සහ සැබෑ ජීවිතයේ ආදර්ශී චරිත පිළිබඳ උදාහරණ ඇසුරින්.

පරිපූර්ණ නාට්‍යයක් දක්වා වර්ධනය වීම කරා වූ ගමනේදී, පුහුණුවීම් අදියරේදී කලුමාලිට තීරණාත්මක වූ කාරණා කිහිපයක් පිළිබඳව මේ අධ්‍යයන ගොනුවේ ඊළඟ කොටසින් අපි සාකච්ඡා කරනවා.

## *කලුමාලි නිර්මාණය කළේ අත්හදාබැලීම් හරහා*

මුලින්ම කලුමාලි හිටියේ නාට්‍යයකට සලකා බැලුණු අදහසක් හැටියට විතරයි. අඩුගානේ ඇය පිටපතක් බවටවත් පත්වෙලා තිබුණේ නෑ. ඉතිං, සම්පූර්ණ නාට්‍යයක් බවට පත්වෙන්න නම් යා යුතු දීර්ඝ ගමනක් ඇය ඉදිරියේ තිබුණා.

පිටපතක්, නිශ්චිත චරිත, නිශ්චිත දර්ශන හෝ දෙබස්...මේ කිසිවක් නැතිව නාට්‍යයක් හදන්නේ කෙසේද යන්න පිළිබඳ කිසිදු පූර්ව අත්දැකීමක් නැති කලාකරුවන් කණ්ඩායමක්, පුහුණුවීම් කාමරයක් ඇතුළේ වැඩ කරමින්, ඉතාම පරිස්සමින් ඇයව ගොඩ නැගිය යුතුව තිබුණා.

එය, කවුරුත් ලෑස්ති වෙලා හිටපු නැති විදියේ විසාල, බය දනවන, අමුතුම ආකාරයේ අත්හදාබැලීමක්.

*ෆිල්ම් ආච්චාගේ කලුමාලිට එයාට*
*වෙන්න කැමති ඕන දෙයක් වෙන්න*
*පුළුවන්*
*මල්ෂානි දෙල්ගහපිටිය*
*ඡායාරූපය - චානුක තියඹරාවත්ත*

කලුමාලි ගොඩනැගීමේ අදියරේදී බොහෝමයක් දේවල් සිදු වූයේ ඓන්ද්‍රීයව වුවත්, ඒ ගමනේ ඉතා පැහැදිලිව හඳුනා ගත හැකි ප්‍රධාන අංග කීපයක් තිබුණා. කලුමාලි ලිවීම, කලුමාලි පුහුණුවීම සහ කලුමාලි වේදිකාවට සැලසුම් කිරීම. මේ එක් එක් අංශය සම්බන්ධයෙන් විශේෂයෙන් වගකීම් කොටසක් බාරගත් කලාකරුවන් කණ්ඩායමේ හිටියා.

එසේ නමුත්, දරුවෙකු වැඩෙන විට මෙන් මේ එක් එක් අදියර නොදැනුවත්වම එකකින් එකකට ගලා ගිය අතර, ඇතැම් විටක ඒවා සිදුවන පිළිවෙල ද වරින් වර වෙනස් වුණා. රංගන ශිල්පීන්ට දෙබස් සහිත පිටපතක් අතට දී අරඹන, වේදිකා සැලසුම් නිර්මාණකරුවන් අවස්ථා කිහිපයක් පුහුණු වීම් නරඹන්නට පැමිණෙන, පිටපත් රචකයන් මංගල දර්ශනය නැරඹීමට පමණක් පැමිණෙන, සාම්ප්‍රදායික නාට්‍යයකට වෙනස්ව, කලුමාලි නිර්මාණ ක්‍රියාවලියේ කොතනින් ලිවීම අවසන් වුවාද, කොතනින් ඩිවයිසින් ආරම්භ වූවාද, කොතනින් පුහුණුවීම් ඇරඹුණාද, කොතනින් වේදිකා සැලසුම්කරණය පටන් ගත්තාද කියා පැහැදිලිව හඳුනාගත නොහැකි වුණා. ඒ සියල්ලම එක විටත්, නමුත් වෙන වෙනමත් සිදු වෙමින් තිබුණා.

කලුමාලි කණ්ඩායම මීට පෙර මෙවැන්නක් අත්දැක තිබුණේ නැහැ. සැබවින්ම මේ අදියරේදී ඔවුන් ඩිවයිසින් යන වචනය පවා අසා තිබුණේ නැහැ. ඔවුන් බොහෝ දෙනෙක් පිටපතක්, දෙබස් සහ නිශ්චිත චරිත සහිත සාම්ප්‍රදායික නාට්‍යවලට සම්බන්ධ වී තිබූ අය. නමුත් කලුමාලි නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේදී මේ කිසිවක්ම නැතිව යන ගමනකට ඔවුන්ට ඇරයුම් ලැබී තිබුණා. පුහුණුවීම් අතරතුර තමන්ගේ චරිතය නිර්මාණය කිරීමටත්, නාට්‍යයේ කතාන්දරය ගොඩනැගීමටත්, නාට්‍යයේ අධ්‍යක්ෂණ දිශාව  තීරණය කිරීමටත් ඔවුන්ගේ දායකත්වය අවශ්‍ය බව ඔවුන්ට දන්වනු ලැබුවා.

පුහුණුවීම්  කරන ශාලාව දෙතුන් දෙනාගේ කණ්ඩායම් තැන් තැන්වල රොක් වෙලා පොඩි පොඩි පර්යේෂණ පවත්වන විද්‍යාගාරයක් වගේ. හදනවා. කපනවා. කොටනවා. ආයිත් හදනවා. ආයිත් කපනවා. කොටනවා. හරි ගියේ නැත්තං විසි කරලා දානවා. නැවත වෙන තැනකින් වෙන අමුද්‍රව්‍ය එක්ක, වෙන විදියකට උත්සහ

කරනවා. පිස්සුම අදහසක් අත්හදා බලනවා. මේ වැනි පර්යේෂණාත්මක ප්‍රවේශයක් සඳහා ශිල්පීන්ගෙන් විශාල ඉවසීමක්, සංයමයක්, කැප කිරීමක් ඉල්ලා සිටිනවා.

වාසනාවකට මෙන් කලුමාලි ගොඩ නැගීම වෙනුවෙන් කැපවුණු, උද්යෝගිමත් රංගන ශිල්පීන් කණ්ඩායමක් එකතු වී සිටියා.

කණ්ඩායමේ විවිධාකාරයේ කලාකරුවන් සිටියා. නළු නිළි කණ්ඩායමේ වයස් පරාසය අවුරුදු 84 සිට අවුරුදු 10 දක්වා වුණා. ලංකාවේ වේදිකා සහ සිනමා ක්ෂේත්‍රයේ ප්‍රවීණතම නළු නිළියන් සේම කුඩා ළමයින්ද ඒ කණ්ඩායමේ සිටියා. නාට්‍ය කලාව හදාරන විශ්වවිද්‍යාල සිසුන් සිටියා. එසේම තමන්ගේ කුඩා දරුවන්ගේ කටයුතු කරන අතර තුර පුහුණුවීම් එන්නට මහත් වෙර වීරියක් දැරූ අම්මලාද සිටියා. එසේම සිංහලෙන් පමණක් වැඩ කරන කලාකරුවන් සේම ඉංග්‍රීසියෙන් පමණක් වැඩ කළ හැකි අයද සිටියා.

නමුත් ඔවුන් සියල්ලෝම එක තනි අරමුණකින් මෙහෙයවෙමින් සිටියා. එනම්, කලුමාලි- වැඩිහිටියන්ට සුරංගනා කතාවක් නැමැති නාට්‍ය නිර්මාණය කිරීමේ නාඳුනන නුපුරුදු ගමන එකට යාමේ අභිමතාර්ථයයි ඒ.

විශ්වාසය, භක්තිය, වෙහෙස වී වැඩ කිරීම, සත්‍යය, කලාව සහ ජීවිතය පිළිබඳ සාර්ථක අසාර්ථක අත්හදාබැලීම් තුළින් ඔවුන් ඉදිරියට පියමන් කරා.

මේ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස මල්ඵල ගැන්වෙන නාට්‍යයක් බිහිවේවිද...!

## කලුමාලි නිර්මාණය වුණේ ගැටුම් තුළින්

**අපි හැමෝම දන්නවා ජීවිතය, කලාව සහ ඉරණම මෙහයවන්නේ ගැටුම් විසින් කියලා.**

**කලුමාලිගේ වර්ධනයටත් කලාකරුවන්ට ගැටුම් අවශ්‍ය වුණා. ඒ නිසා අකාර දෙකකට ගැටුම් නිර්මාණය කරා.**

**කලුමාලි තුළම ගැඹුරු අභ්‍යන්තර ඝට්ටනයක් නිර්මාණය කළා.**

**කලුමාලිගේ පවුල තුළ ඝට්ටනයක් නිර්මාණය කළා.**

*සකී කන්නේ නෑ. කෞෂල්‍යා ප්‍රනාන්දු, ශලීනා මුතුමුදලිගේ සහ පීටර් දි අල්මේදා ඡායාරූපය - රුවින් ද සිල්වා*



*කලුමාලිගේ දෛවය කතා කරයි. ජුවනීටා බීලිං සහ වේදිකා සහයකයින්. ඡායාරූපය - චානුක තියඹරාවත්ත*





ලක්මිණී සෙනෙවිරත්න දිල් ලෙස.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත



*දිල්ලා දෙදෙනෙක් පුහුණු වෙමින්.*
නදී කම්මැල්ලවීර සහ ලක්මිණී සෙනෙවිරත්න

### *කලුමාලි තුළම ඝට්ටනයන්*

Passing Stage අත්පිටපතේ ගැබ් වී තිබුණු ගැටුම.

**කලුමාලි Passing Stage අත්පිටපත සමඟ අත්‍යන්තයෙන්ම බැඳී තිබුණා. පිටපත් රචකයන්, කලුමාලි නාට්‍යයේ සහ එහි ප්‍රධාන චරිතය වන 'දිල්' ගේ කේන්ද්‍රීය ඝට්ටනය සහ කේන්ද්‍රීය අනන්‍යතාව උකහා ගත්තේ මේ අත්පිටපතෙන්.**

මේ කේන්ද්‍රීය ඝට්ටනය පහත දැක්වෙන සරල ප්‍රශ්න තුනට සම්බන්ධ කළ හැකියි.

*අපට උරුම වී ඇත්තේ මොනවාද?*

*අප විශ්වාස කරන්නේ මොනවාද?*

*අපි අපේ දරුවන්ට උරුම කර දෙන්නේ මොනවාද?*

මේ වාක්‍යය තුන, කලුමාලි නාට්‍යයේ ප්‍රධාන චරිතය වන දිල්ගේ කේන්ද්‍රීය ඝට්ටනය සාරාංශ කොට දක්වනවා. මේ ප්‍රශ්න තුන තමයි අම්මලා වුණු කලාකාරිනියන් 13 දෙනෙක් විසින් ලියූ Passing Stage අත් පිටපතේ ඇතුළත් 7 වෙනි අවසාන රචනා අභ්‍යාසයට මූලික පදනම වුණේ.

මේ ප්‍රශ්න තුනට පිළිතුරු සොයාගැනීම තුළින්, දිල් තමන් තමන්ගේ දියණියට කොයි ආකාරයේ මවක් වී සිටින්නේද යන්නත් ෆිල්මි ආච්චා නම් වන තමන්ගේ මව තමන්ට කොයි ආකාරයේ රසවත් මවක් වීද යන්නත් අතර ඇති පරතරය අවබෝධ කරගන්නවා. මේ අවබෝධය වේදනාත්මකයි. මන්ද, දිල්ට තමන්ගේ දුව වෙනුවෙන්, තමන්ගේ මව තමන්ට වුණා සේ හයිය, නිදහස්කාමී අම්මා කෙනෙක් වෙන්න බැරි වුණා. සත්‍යය නම්, අම්මා කෙනෙක් වීමේ අත්දැකීම විසින් දිල් තමන්ට තමන්වත් හඳුනාගත නොහැකි මට්ටමටම මහා විපරීත විපර්වර්තනයකට ලක්ව සිටියාය යන්නයි.

දිල්ගේ කේන්ද්‍රීය ගැටුම වූයේ, මවක් බවට පත් වූ පසුව ඇයට ඇයවම අහිමි වී යාමයි. ඒ අහිමි වී යාම තුළ තමන් තමන්ගේ දියණිය සකීට උරුම කරන දේ සම්බන්ධයෙන් ඇය තුළ විශාල අසතුටක්, අතෘප්තියක් නිර්මාණය වීමයි.

Passing Stage අත්පිටපතේ ප්‍රධාන ප්‍රශ්න තුන, මවක් ලෙස දිල් තුළ තිබූ කේන්ද්‍රීය ඝට්ටනයට පදනම සැපයූ අතර ඇයට තමන්ගේ මව සමඟ, තමන් සමඟම සහ

තම දියණිය සමඟ තිබූ සම්බන්ධතාව විදාරණය කළා. ඒ ඝට්ටනයන් තුළින් ඇති කළ වේදනාව තමයි දිල්ව ඒවාට එරෙහිව ක්‍රියාත්මක වීමට පෙළඹවූයේ. එසේම ඒ වේදනාවම තමයි කලුමාලි නාට්‍යයේ කතාන්දරය ඉදිරියට ප්‍රක්ෂේපණය කළේ.

මේ ප්‍රශ්න ත්‍රිත්වය නාට්‍යය තුළ චරිත එකිනෙක අතර සම්බන්ධතාවට අදාළ වන්නේ කෙසේද යන්න අපි දැන් විමසා බලමු.

***අපට උරුම වී ඇත්තේ මොනවාද?* - නැතිනම්, දිල්ගේ අම්මා ඇයට උරුම කර දී ඇති වටිනාකම් මොනවාද?**

- තමන්ගේ අම්මා වන ෆිල්ම් ආච්චා සම්බන්ධයෙන් දිල්ගේ අත්දැකීම - සමාජයේ පොදුවේ පිළිගත් වටිනාකම් සහ කොන්දේසි ඉක්මවා ගිය, තමන්ගේ ජීවිතය තමන්ගේම විශ්වාසයන් මත ගෙන ගිය, තමන්ගේ දියණියට වත්තේ හැදෙන වල් පැලයක් සේ නිදහසේ හැදෙන්නට ඉඩ හැරිය, සමාජය මොනවා සිතාවිදැයි බියෙන් තමන්ගේ සිහින තමන්ගේ දරුවා වෙනුවෙන් කැප නොකළ නිදහස් ගැහැණියක්.

***අපි විශ්වාස කරන්නේ මොනවාද?* - නැතිනම්, දිල් ජීවත් වෙන්නේ කුමන ඇගයුම් සහ වටිනාකම් අනුවද?**

- දිල්ට තමා සමඟම ඇති සම්බන්ධතාව නිර්ණය වී ඇත්තේ, සම්පූර්ණයෙන්ම තමන්ගේ දරුවාගේ අවශ්‍යතා සහ උවමනාවන් වෙනුවෙන්ම පමණක් සීමා වූ අතිශය වෙහෙසකාරී පැවැත්ම නමැති හිරි වැටුණු යථාර්ථය තුළින්. කෙසේ නමුත් තමන් ඉස්සර නොබියව සමා[?]ජ සීමාවන් අබිබවා ගිය, පුළුල් ජීවිතයක් ගෙවූ අයෙකු බව දිල්ට තාමත් මතකයි.

### *අපි අපේ දරුවන්ට උරුම කරන්නේ මොනවාද?* - **නැතිනම්**
### *දිල් සකීට ලබාදෙන ආදර්ශයන් මොනවාද?*

දිල්ට සකී එක්ක තියෙන සම්බන්ධතාව. සකී සම්පූර්ණයෙන්ම අම්මා මත යැපෙනවා. ඇගේ අම්මා කලින් කවරෙක් වී සිටියාද කියා ඈ දන්නේ නැහැ. එසේම තමන්ගෙන් බාහිරව ඇයට ජීවිතයක් සහ ලැදියාවන් ඇති බවක් ඇය දන්නේ නැහැ. ඇය තමන්ගේ අම්මට අසීමිතව ආදරය කරන, හැම නිමේෂයකම ඇය වටාම භ්‍රමණය වන, සෑම සියලු දේකටම අම්මා වෙතට හැරෙනවා මිස වෙන කුමක් කරන්නදැයි නොදන්නා දරුවෙක්.

කලුමාලි පිටපත ලියූ රුවන්ති සහ නදී වටහාගත්තා ආච්චි අම්මා (ෆිල්මි ආච්චා), අම්මා (දිල්) සහ දරුවා (සකී) අතර ඇති ත්‍රිකෝණික සම්බන්ධතාව සහ උක්ත ප්‍රශ්න ත්‍රිත්වය තමයි නාට්‍යයේ කේන්ද්‍රීය ඝට්ටනය විය යුත්තේ කියා. අම්මාවරුන් වූ කලාකාරිනියන් හැටියට ඔවුන් තමන්ගේම ජීවිත ඇතුළේ මුහුණ දෙමින් සිටි මූලික ඝට්ටනයත් මෙයමයි. මෙය අද දවසේ දෙමාපියන් වීමේ පීඩනය එක්ක හැප්පෙන ගැහැණුන්ගේ පොදු යථාර්ථයක් බව පැහැදිලි ව පෙනුණා.

ඔවුන් මේ ඝට්ටනය වඩාත් පුළුල් කිරීම සඳහා උචිත අමුද්‍රව්‍ය සොයන්නට ආයිමත් Passing Stage අත්පිටපත දිහාට හැරුණා. අම්මාවරුන් වූ කලාකාරිනියන් විසින් ලියා තිබූ, මේ ඝට්ටනයේ හරය ගැබ්වුණු රචනා තුනක් ඔවුන් තෝරා ගත්තා.

මේ ඒ රචනා තුනයි.

1. ***කලුමාලි සුරංගනා කතාව***

2. ***මට මගෙන් ලියුමක්***

3. ***මා ගැන ළමා ගීයක්***

### 1. කලුමාලි සුරංගනා කතාව - (අපට උරුම වී ඇත්තේ මොනවාද?)

කලුමාලි සුරංගනා කතාව, කැලිබ්‍රි නමින් නම් කළ රචිකාවියක් විසින් 'තමන් ගැනම සුරංගනා කතාවක් 'යටතේ Passing Stage අත්පිටපතට ලියා තැබූ හාස්‍ය රසය මුසු වුණු කුඩා කතාවක්. එයින්, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවන් පිළිබඳව සමාජයේ ඇති පොදු ආකල්ප ප්‍රශ්න කළා.

"කලුමාලි ඉපදුණු වෙලාවෙ සුරංගනා ලෝකේ සුරංගනාවියො හිටියෙ සැප නින්දේ. හොඳටම නිදිමතේ වැනි වැනී සුරංගනාවියො දෙන්නෙක් කලුමාලිගේ ගෙදරට පියාඹගෙන ආවා. එයාලා හිටියේ නින්ද කැඩුණු තරහින්. කලුමාලි දිහා ඕනවට එපාවට බලපු එක සුරංගනාවියක් හිතුවෙ ඒ පිරිමි බබෙක් කියලා. ඉතිං එයා කලුමාලිට තෑගි දුන්නේ අතේ පයේ රෝම, නිකටට උඩින් හීනි දැලි රැවුල, හැඩි දැඩි පාද, බාහුවල මස්පිඬු, ගස්ගල් උඩ නගින ආසාව, රෑ ඇවිදින බය නැති කම...වගේ පිරිමි ළමයෙකුට වැදගත් වෙන දේවල්.
අනිත් සුරංගනාවිටත් නිදි මරගාතේ ඒ තරං නිච්චියක් නැති වුණත් එයා කලුමාලිට දුන්නෙ ගෑනු ළමයෙකුට දෙන ජාතියෙ තෑගි. එයා දුන්නා ලස්සන දිග සේද කොණ්ඩෙ, දුක හිතුණාම ඇඬෙන ඇස්, ගෑනු හිත, බබලා හදන මල්ල, බාබාලා හදන උවමනාව..."

(උපුටා ගැනීම - Passing Stage අත්පිටපත, 4 වෙනි අභ්‍යාසය)

**මේ කතාව තමන්ටම ආවේණික විශ්වාසයන්ට අනුව ජීවිතය ගෙවූ, ජීවිත කාලය පුරා කළ තෝරාගැනීම් හරහා සම්මත ස්ත්‍රී පුරුෂ අනන්‍යතා පිළිබඳ ආදර්ශයන් බිඳ දැමූ, පිටපතේ ශක්තිමත් ස්ත්‍රී චරිතය වන ෆිල්ම් ආච්චාගේ චරිතය සඳහා යොදාගත්තා. කලුමාලි සුරංගනා කතාව, නාට්‍යයේ ආරම්භයේදී ෆිල්ම් ආච්චි සකීට කියන ඇගේ ජීවිතය පිළිබඳ සුරංගනා කතාව හැටියට වර්ධනය කළා.**

මේ පුංචි කතාව, ගැහැණියක් සහ මවක් වීම කියන්නේ කුමක්ද යන්න පිළිබඳව දිල් ඇගේ අම්මා වන ෆිල්මි ආච්චා ගෙන් ඉගෙන ගත් දේ පිළිබිඹු කරා.

*දිල් ඇගේ මව, ෆිල්මි ආච්චා සමඟ. නදී කම්මැල්ලවීර සහ ජුවනීටා බීලිං*
ඡායාරූපය - පසන් රණවීර



*විදුහල්පති හමුවීම. ලක්මිණි සෙනෙවිරත්න*
ඡායාරූපය - චානුක තියඹරාවත්ත



## *2. මට මගෙන් ලියුමක් - (අපි විශ්වාස කරන්නේ මොනවාද?)*

මේ තියෙන්නේ, Passing Stage අත්පිටපතට ' මට මගෙන් ලියුමක් ' යටතේ කැම්බ්‍රියා විසින් ලියා තැබූ කවියක්.

මට ලියන්න හැමදාම
ඔයා නැතුව මට පාළුයි
ඔයා කවුදැයි මට මතක් කරල දෙන්න
මට අමතක වෙමින් යනවා
ඔයා වටේ ඉන්න අනිත් හැමෝටමත් අමතක වෙමින් යනවා වගෙයි
එතකොට ඔයාගෙ දරුවො- ඇයි, එයාලා කවදාවත්, කවදාවත්ම දැනගන්න එකක් නැහැ....

ඔයාගේ
මම

(උපුටා ගැනීම - *Passing Stage* අත්පිටපත, 1 වන අභ්‍යාසය - ලියුම්)

මෙය කලුමාලි නාට්‍යයේ පළවෙනි ජවනිකාවේ අවසානයේත්, නැවතත් හය වෙනි දර්ශනය අවසානයේත් එන තීරණාත්මක වදන් පේළියක් හැටියට යොදාගත්තා. ෆිල්ම් ආච්චා, දිල් සහ සකී යන චරිත තුනම නැවත නැවත අවස්ථා කිහිපයකදීම මේ කවිය පුනරුච්චාරණය කරනවා.

කලෙකට ඉහතදී ශක්තිමත්, ක්‍රියාකාරී ස්වාධීන ගැහැණියක්ව සිටි, මේ වන විට තමන්ට තමන්ව හඳුනාගත නොහැකි මට්ටමටම වෙනස් වී ඇති කතාවේ ප්‍රධාන චරිතය වන දිල් ගේ කේන්ද්‍රීය ගැටලුව මේ කවිය තුළින් පිළිබිඹු වුණා.

## *3. මා ගැන ළමා ගීයක්* - *(අපි අපේ දරුවන්ට කියාදෙන්නේ මොනවාද?)*

මේ, Passing Stage අත්පිටපතට 'මා ගැන ළමා ගීයක්' නමැති රචනා අභ්‍යාසයට ප්‍රතිචාරයක් ලෙස කැම්බ්‍රියා විසින් ලියූ නිර්මාණයක්.

*ඔයා කවුද?*
මං ඔයාගෙ අම්මා

*නම මොකක්ද?*
අම්මා

*ඔයාගෙ මූණ මොන වගේද?*
මහන්සි පාටයි

*ඔයාගෙ අත් මොන වගේද?*
හරිම කලබලයි

*ඔයාගෙ ඔලුව කොහෙ තියෙන්නෙ?*
ඈත. ඈත

*ඔයාගෙ හදවත කොහේද?*
හුඟක් වෙලාවට මෙතනම

*ඔයාගෙ ඇස් කොහෙ තියෙන්නෙ?*
ඔයාගෙ ළඟ

*ඔයාට මොනවද පේන්නෙ?*
මුළු ජීවිතකාලයක්ම

*මොනවද ඔයා දන්නෙ?*
මුකුත් නැහැ

*මොනවද ඔයා දන්නෙ නැත්තෙ?*
හොයන එක කොහොමද නවත්තන්නෙ

*කාටද ආදරේ ඔයා?*
ඔයාට

*ඔයා නිදාගන්නෙ කොයි වෙලේද?*
ඔයා නිදාගන්න වෙලාවකට

*ඔයා කන්නෙ කොයි වෙලේද?*
ඔයා කාලා ඉවර වුණාම

*ඔයා නාන්නෙ කොයි වෙලේද?*
පුළුවන් වුණ වෙලාවකට

*ඔයා හිනාවෙන්නෙ කොයි වෙලේද?*
මට අමතක වෙන වෙලාවෙ

*ඔයා අඬන්නෙ කොයි වෙලේද?*
මට මතක් වෙන වෙලාවෙ

*ඔයා සින්දු කියන්නෙ කොයි වෙලේද?*
කාර් එක එළවන වෙලාවෙ



*මම කවුද අම්මි?* ලක්මිණී සෙනෙවිරත්න සහ ශලීනා මුතුමුදලිගේ. ඡායාරූපය - රුවින් ද සිල්වා

*ඔයා නටන්නෙ කොයි වෙලේද?*
මම නටන්නෙ නෑ

*ඔයා උයන්නෙ කොයි වෙලේද?*
හැමදාම

*සුද්ද කරන්නෙ කොයි වෙලේද?*
මුළු දවසම

*වැඩට යන්නෙ කොයි වෙලේද?*
වැඩ කරන්නෙ නෑ මම

*දැන් ඔයා කවුද?*
මං දන්නෑ

*කලින් හිටපු ඔයා කවුද?*
මට මතක නෑ

*ඔයා කවුරු වේවිද?*
කවුරු වුණත් මට මොකටද

*මම කවුරු වේවිද?*
ලස්සන සුරංගනාවියක්

*මම කවුද?*
ඔයා මගේ ජීවිතේ



*දිල් දෙදෙනා සකීලා දෙදෙනා සමග.* නදී කම්මැල්ලවීර, ලක්මිණි සෙනෙවිරත්න, සහලා අනීස් සහ ශලීනා මුතුමුදලිගේ
ඡායාරූපය - ශ්‍යාමල් මුතුමුදලිගේ

(උපුටා ගැනීම - *Passing Stage* අත්පිටපත - 4 වෙනි අභ්‍යාසය )

මේ කවියෙන් උපුටා ගත් කොටස් කලුමාලි නාට්‍යය පුරාම අම්මා සහ දුව අතර කෙරෙන කුඩා ප්‍රශ්නෝත්තර සෙල්ලමක් හැටියට යොදාගත්තා. සකී ප්‍රශ්න අහනවා. අම්මා ඒවාට උත්තර දෙනවා. අම්මා සහ දියණිය අතර සම්බන්ධතාව කොයිතරම් සම්පද යන්නත්, දියණිය අම්මාගේ මානසික තත්ත්වය එහා මෙහා වීම සම්බන්ධයෙක් කොයිතරම් සියුම් ලෙස සංවේදීද යන්නත් මේ මගින් පිළිබිඹු වෙනවා.

**තම දරුවා වෙනුවෙන් අප්‍රමාණික ස්නේහයක් දක්වමින්, අපරිමිත ආත්ම පරිත්‍යාගයන් කිරීමට දිල් තුළ ඇති ශක්‍යතාව මේ තුළින් කියවෙනවා. ඒ හැඟීම කොයි තරම් ප්‍රබලද යත්, එය ඇයව තමන් කවුද යන සංවේදනයෙන් පවා ඈත් කරවනවා. අවසානයේ ඇය දරුවෙකුගේ අවශ්‍යතා වෙනුවෙන්ම පමණක්, අම්මා කෙනෙක් හැටියටම පමණක් මේ ලොව පවතින පුද්ගලයෙක් බවට පත්වෙනවා.**

මේ ආකාරයට උක්ත සුරංගනා කතාව, කවිය සහ සිංදුව දිල්ට ඇගේ මව, ඇගේ දියණිය සහ තමන් සමඟම ඇති සම්බන්ධතාව හරහා ඇගේ ජීවිතයේ කේන්ද්‍රීය ගැටුම හැඩගැස්වුවා. තවදුරටත් දිල්, තමාව තම දියණියගෙන් වෙන්ව හඳුනාගත හැකි අනන්‍යතාවක් සහිත පුද්ගලයෙකු නොවේ. මේ වනාහි, ඇයට ඇගේ මව සමඟ තිබූ සම්බන්ධතාවට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ එකක්. මේ ඝට්ටනය කලුමාලි නාට්‍යයට ශක්තිමක් කශේරුකාවක් සපයා දුන්නා. එසේම කලුමාලි නාට්‍යය සහ Passing Stage මුල් අත්පිටපත අතර ආත්මීය සහ සම්බන්ධතාවක් ගොඩ නැගුවා. එසේම එය කලුමාලි නාට්‍යයට මෙන්ම දිල් නමැති ප්‍රධාන චරිතයට ගැඹුරු අනන්‍යතා ගැටුමක් නිර්මාණය කර දුන්නා. හැම විටම තමන්ගේ ඉරණම සොයා යාමේ ගමනක් ඇරඹෙන්නේ මෙවැනි ගැටුමකින්...
එය නාට්‍යයේ කතාව ඉදිරියට තල්ලු කරා. කලාව නිර්මාණයක් හැමවිටම මේ තල්ලුව ලබාගන්නේ ඝට්ටනයකින්.





*කලුමාලිගේ පවුල තුළ ඝට්ටනය*

**කලුමාලි නාට්‍යය සහ දිල්ගේ කතාන්දරය නොනවත්වා ඉදිරියට යාම සඳහා දිල්ට ඇය සමඟම සේම ඇගේ සමීප පවුල සමඟද ඝට්ටනයක් ඇති කිරීම අවශ්‍යයයි.**

**කලා ශිල්පීන් වෘන්දය දැන් අවධානය යොමු කළ යුතු වූ කාරණය මේ ඝට්ටනය නිර්මාණය කරන්නේ කෙසේද යන්නයි.**

**සාමකාමී යහපත් මිනිසුන්ගෙන් සැදුම්ලත්, බැලූ බැල්මට සතුටින් සිටින සුන්දර කුඩා පවුලක් තුළ තිබිය හැක්කේ කවරාකාරයේ ගැටුම් ද?**

**ඒ ගැටුම් ප්‍රකාශයට පත්වෙන්නේ කෙසේද?**

කලුමාලි පවුල තුළ ගැටුම් ගැන කතා කරන්නට පෙර, ප්‍රධාන පවු□ලේ සැකැස්ම දෙස මඳකට බලමු.



## කලුමාලි පවුල හඳුන්වා දීම

*දිල් - "හැමෝම කරන දේවල් කරනකොට ආරක්ෂාවක් දැනෙනවා"*

**අම්මා** - අම්මා වෙන්න කලින් ජනමාධ්‍යවේදිනියක්, ඉස්සර ලොකු සිහින තිබුණා. සොයා යන්නට රුචි අනුරාගයෙන් ඇලළුණු ආත්මයක්.



*මෙම පිටුව (ඉහළ)*
*ලක්මිණි සෙනෙවිරත්න දිල් ලෙස.*
ඡායාරූපය - රුවින් ද සිල්වා

*මෙම පිටුව (පහළ)*
නදී කම්මැල්ලවීට දිල් ලෙස.
ඡායාරූපය - රුවින් ද සිල්වා



*කළණ - ''ඒකනේ බලන්න. මට දුකක් දැනුණාම මං කරන්නෙ ඉක්මනටම මේ දුක නැතිවෙලා යාවි කියලා මටම කියාගන්න එකයි. සිංදුවක් කියලා, ෆිල්ම් එකක් බැලුවාම හිතේ කරදර නැති වෙනවා.''*

**තාත්තා -** වැඩ කරන, බඩු ගන්න, පත්තර කියවන, දරුවා හැදීම ගැන අදහස් යෝජනා දෙන, බාත්රූම් සින්ක් එකේ තෙත අන්ඩවෙයාර් එක දමා යන, කාර්යබහුල, සාමකාමී සැමියෙක්.

පීටර් ද අල්මේදා කළණ ලෙස.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත



මිරංග ආරියරත්න කළණ ලෙස.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත

*සකී - “අම්මී, ඔයා කවුද?”*

**ගෙදර පොඩි එකා** – දිල්ගේ සහ කළණාගේ අට හැවිරිදි දියණිය. හැමෝගෙම සුරතලය ලබන, අම්මාට තදින්ම බැඳුණු දියණිය.



ශලීනා මුතුමුදලිගේ සකී ලෙස.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත



සහලා අනීස් සකී ලෙස.
ඡායාරූපය - ශ්‍යාමල් මුතුමුදලිගේ



*ගෙදර ආච්චී - "පුතා, දේවල් දිගටම කරගෙන ආපු විදියට කෙරෙන්න හේතුවක් තියෙනවා. මාංචුවල ආරක්ෂාවක් තියෙනවා..."*

**කළණගේ අම්මා** - දිල්ගේ නැන්දම්මා. කළණගේ අම්මා. පවුල, ගෑනුන්ගේ වගකීම, දරුවන් හැදීමේ ශාස්ත්‍රය ගැන ගලේ කෙටූ ඉපැරණි අදහස් දරා සිටින්නිය. අනතුරු අවදානම් ගැන නිතර බයවෙන්නිය. පවුල වෙනුවෙන් බර අදින්නිය.

කෞෂල්‍යා ප්‍රනාන්දු ගෙදර ආච්චි ලෙස.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත



*ෆිල්ම් ආච්චා - ''දරුවෙක් ලැබුණායි කියලා තමන්ව නැති කරගන්න එපා''*

**දිල්ගේ අම්මා** - නිළියක්. අත්තටු විහිදා ඉර දිහාට ඉගිල ගිය කෙනෙක්, දරුවන් හැදීම සහ මව් වගකීම් ඉටු කිරීම පිළිබඳව තමන්ගේම ක්‍රමයක් කෙරෙහි විශ්වාසය තැබූ, සැක සංකා වලින් තොරව ඒ ඔස්සේ ගිය නිදහස් චරිතයක්.

ජුවනීටා බීලිං ෆිල්ම් ආච්චා ලෙස.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත්

අනිත් පිටුව - සංජය සේනානායක (දකුණු පස සිට දෙවෙනියට සිටගෙන සිටින) පුහුණුවීම් රූගත කරමින්.
ඡායාරූපය - පසන් රණවීර


14
15
16
17
19

## කලුමාලි පවුල තුළ ගැටුම නිර්මාණය කළ ආකාරය

කලුමාලි පවුල තුළ විශ්වසනීය, යථාර්ථවාදී සහ හදවතට දැනෙන ආකරයේ ගැටුම් නිර්මාණය කිරීමේදී කලුමාලි පිටපත් රචකයක් වරින්වර Passing Stage අත්පිටපත වෙතට හැරුණා. එසේම අත්පිටපතෙන් බාහිරව ඇතැම් දර්ශන අලුතෙන්ම නිර්මාණය කළ යුතු බවත් ඔවුන් අවබෝධ කරගත්තා.

අපේ මේ අධ්‍යයන ගොනුව වෙනුවෙන්, මේ ආකාර දෙකටම ඩිවයිසින් ක්‍රමවේදය යොදාගත් ආකාරය විමසා බලමු.

## අත්පිටපතින් උකහා ගත් දර්ශන

### 1. දර්ශනය - ක්ලේ ගුලි

මේ නාට්‍යයේ මුල් දර්ශන අතුරින් එකක්. ඇත්තටම මේ තමයි, දිල් සහ කළණ, කළණගේ මව සමඟ ජීවත් වෙන නිවසේ, යම්කිසි ආතතියක් අප පළවෙනි වරට හඳුනාගන්නා අවස්ථාව.

මේ දර්ශනය සඳහා පෙලඹුම ලැබුණේ Passing Stage අත් පිටපතට මොනෑකෝ ලියා තිබූ කවියක් ඇසුරින්.

මුල් කවිය මෙසේයි......

## මොනැකෝ - මා වෙතම ලියූ ලිපියක්

සමහර දාට, මැදියම් රෑ
ගෙදර කට්ටිය සුව නින්දේ
වසා දැමූ කාමරයට මං රිංගනවා
හෙම්බත්, කඩමලු වෙච්ච, හොඳටම ක්ෂය වෙලා ගිය මම
දැවෙන දෑස් පියා ගන්නවා......
ඒත්, නින්ද මගෙන් ගිලිහිලා යනවා.
හැමදාමත් මේ වගේ පරක්කුයි...... පරක්කු වැඩියි

ඒත් තවමත්, කරන්න වැඩ කන්දරාවක් තියනවා
බබාගේ තම්බන්න තිබුණ සූප්පුව - පැනලා ගිහින්
සුදු සපත්තුවක්, ක්ලේ ගුලියක, මේස් කකුලක් - පඩිපෙල දිගට
මැදපු ඇඳුම් කන්ද ඉවසිල්ලෙන් බලන් ඉන්නවා, අණ ලැබෙනකන්
ප්‍රශ්නාර්ථයක්
කන්න ගෙනියන්න දාන්නේ මොනවද......
සම්පූර්ණ, සුසැදි නිමාවන් කියලා ජාතියක් මා සතු නැහැ

(උපුටා ගැනීම Passing Stage අත්පිටපත - 4 වෙනි අභ්‍යාසය)

## 2. ක්ලේ ගුලි දර්ශනය ඩිවයිස් කිරීම

මේ දර්ශනය ඩිවයිස් කරන විට, පවුලකට එකම අවකාශයක් සහ එකම බඩු භාණ්ඩ පොදුවේ භාවිතා කරමින්, නමුත් වෙන වෙනම තමන්ගේ ලෝකවල ජීවත් වීමට ඇති හැකියාව විමසා බැලුණා. ඔවුන් පොදුවේ භාවිතා කරන අවකාශය සහ බඩු මට්ටු සමඟ එකිනෙකාට ඇති සම්බන්ධතාව වෙනස්ය යන කාරණය පිරික්සා බැලුවා.

සුපුරුදු වටපිටාව, සුපුරුදු බඩු මුට්ටු සහ වෙනස් නොවන එකම දින චරියාව සමඟ විඩාපත්, ඒකාකාරී පරිසරයක් ගොඩ නැගීම අවශ්‍ය වුණා. එකම පොදු අවකාශයක් හරහා එහා මෙහා යමින්, පොදු බඩු භාණ්ඩ පාවිච්චි කරමින්, එකිනෙකාට කිසිදාක මුණ නොගැසෙන සමාන්තර ලෝකවල ජීවත්වෙන මිනිසුන්ට සිදුවෙන්නේ කුමක්ද?

*ක්ලේ ගුලි. පීටර් ද අල්මේදා*
*ඡායාරූපය - රුවින් ද සිල්වා*



### *ඩිවයිසින් අභ්‍යාසය*

මොනැකෝගේ විඩාපත් කවිය මේ දර්ශනය නිර්මාණය කිරීම සඳහා හරියටම ගැළපුණා. දවසක් නිමාවේ, නිවසේ සාලය හරහා ඇවිදගෙන යන අම්මාගේ ම□නෝභාවය. කවි□යේ සඳහන් වෙන සියලුම □බඩු, සහ දේවල් නළු නිළියන්ට ලබා දුන්නා. ඒත් එක්කම කවියෙන් උපුටා ගත් ප්‍රශ්නයකුත් ඔවුන්ට දුන්නා.

ක්ලේ ගුලියක්

තනි මේස් කකුලක්

රෙදි කන්දක්

“රෑට කන්නෙ මොනවද?”

දෙන ලද අවකාශයට ඇතුළු වෙමින්, මේ දෙන ලද දේවල් සමඟ සහ සම්බන්ධතාවක් නිර්මාණය කරන ලෙස ශිල්පීන්ට උපදෙස් දුන්නා. ‘රෑට කන්නෙ මොනවද?’ කියන ප්‍රශ්නය කිසියම් අවස්ථාවක ඔවුන් විසින් ඇසිය යුතු බවත් කිව්වා.

කලණ, ගෙදර ආච්චී සහ දිල් චරිත නිරූපණය කරන නළු නිළියන් ඔවුන්ගේ චරිත වලට ආරූඪ වී මේ එකම අවකාශයට ඇතුල් වී එහි හැසිරෙමින් වට පිටාවේ ඇති දේවල් වලට ප්‍රතිචාර දැක්වුවා.

***3. මේ අභ්‍යාසය අවසානයේ නිර්මාණය කොට පිටපතට ඇතුළු කළ දර්ශනය මෙයයි.***

***1 අංකය. 4 වන දර්ශනය - ක්ලේ ගුලි...***

ගෙදර ආච්චා පිවිසෙයි.

***ගෙදර ආච්චා :*** ක්ලේ ගුලි... මේස් කකුල්.
කරන්න වැඩ කන්දරාවක් තියෙනවා
රෙදි කන්දක් මෙතන.
රෑට කන්න තියෙන්නෙ මොනවද දන්නෑ?
දැන් කළණ පුතා එන වෙලාව....
පරක්කුයි... හැමදාම පරක්කුයි....

***ගෙදර ආච්චි පිටවෙයි.***

***බ්‍රීෆ් කේස් එකක් රැගෙන කළණ පිවිසෙයි.***

***කළණ:*** ක්ලේ ගුලි... සුදු සපත්තුවක්... මේස් කකුල්.
රෙදි කන්දක් අතන....
අපේ ගෙදර...
රෑට කන්න තියෙන්නෙ මොනවද දන්නෑ...

**කළණ තම සපත්තු ගලවා, බෑගය ද සමඟ එතන බිම තබද්දී පිටව යයි.**
**දිල් පිවිසෙයි.**

**දිල්:** සුදු සපත්තුවක්... මේස් කකුල්... ක්ලේ ගුලියක්
මේ රෙදි කන්ද
කරන්න වැඩ කන්දරාවක්තව
රෑට කන්න හදන්නෙ මොනවද?

**ඇය කළණ බිම දමා ගිය සපත්තු දෙක සහ බ්‍රීෆ් කේසයත්, අනෙක් දේවලුත් අස් කරයි. දිල් පිටවෙයි.**

(උපුටා ගැනීම - කලුමාලි වැඩිහිටියන්ට සුරංගනා කතාවක්,
1 වෙනි අංකය. 4 වෙනි දර්ශනය )



ලක්ෂ්මිණී සෙනෙවිරත්න දිල් ලෙස.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත



## අලුතෙන්ම ලියූ දර්ශන

### 1. පත්තර දර්ශනය

මේ දර්ශනය එන්නේ කලුමාලි නාට්‍යයේ 1 වෙනි අංකයේ අවසානයේ. (කලුමාලි කියන්නේ අංක 3 කින් සමන්විත නාට්‍යයක්) මේ පවුල එකට එක්ව වාඩි වී, සුපුරුදු දෛනික කටයුත්තක නිරත වී සිටිනවා අප පළවෙනි වතාවට දකින්නේ මේ දර්ශනයෙන්.

ඔවුන් එකට එක්ව කරන මේ කාර්යය, සති අන්තයේ පත්තර කියවීම නැමැති සාමාන්‍ය ප්‍රසන්න කටයුත්තක්.

කෙසේ වුවත් පවුලේ අය එක්ව නිරතුරුවම නියැලෙන මේ කාර්යය අවසානයේ, දිල්ට තමා පවුලේ අනෙක් අයගෙන් දුරස්ථ, අතිශයින් හුදෙකලා වූ චරිතයක් බව දැනෙන්නට පටන් ගන්නවා.

### 2. පත්තර දර්ශනය ඩිවයිසින් කිරීම

බොහෝ විට පවුල් අතුළේ අර්බුද ආරම්භ වෙන්නේ අපේක්ෂා නොකරම, අතිශයින්ම සාමාන්‍ය අවස්ථාවක. පවුලක දෛනික හැසිරීම් අතරතුර, යමෙකුට කිසි කෙනෙකු විසින් නොදැක, නොදැන මහා අර්බුදයක් සංවේදනය විය හැකියි.

මේ අදහස ඇතුව, අපි පවුලක නිරන්තරයෙන් දිනපතා පාහේ සිදුවන, ප්‍රසන්න, සාමකාමී සිදුවීමක්, එනම් සියලු දෙනා එකතුව පත්තර කියවීමේ අවස්ථාවක් යොදා ගත්තා. අපේ අරමුණ වුණේ, කතා නායිකාව වන දිල් හුදෙකලා වන තත්ත්වයකට ඒ අවස්ථාව පෙරළීමයි.

පත්තර දර්ශනය රඟදක්වමින්.
ලක්මිණි සෙනෙවිරත්න,
පීටර් ද අල්මේදා,
කෞෂල්‍යා ප්‍රනාන්දු සහ
ශලීනා මුතුමුදලිගේ
ඡායාරූපය - චානුක තියඹරාවත්ත

### *ඩිවයිසින් අභ්‍යාසය.*

සියලුම දෙනාට සති අන්ත පත්තර ලබා දුන්නා. තමන් නිරූපණය කරන චරිතය වඩාම උනන්දු වෙනු අතැයි සිතෙන ලිපි එකිනෙකා විසින් තේරිය යුතුව තිබුණා. ඒත් සමඟම පවුලේ අනෙක් අය කැමති අතැයි තමන් සිතන ආකරයේ ලිපි සහ පිටු ඔවුන්ට නිර්දේශ කිරීමත් ඔවුන් විසින් කළ යුතු වුණා.

ඒ අනුව කළණ පිටු පෙරළාගෙන පෙරළාගෙන ගොස්, බඩු භාණ්ඩවල වෙළඳී දැන්වීම්, ඉඩකඩම් දේපළ දැන්වීම් ඇති පිටුවල නැවතුණා. ගෙදර ආච්චී කෙළින්ම ලග්න ඵලාපල පිටුව දිග ඇරගත්තා. දිල්, උතුරේ අතුරුදහන් වීම් සහ මානව හිමිකම් පිළිබඳ කතා කරන ලිපියක් තෝරා ගත්තා. ඔවුන් එකිනෙකා සමඟ කතා කර කර ඒ තෝරාගත් දේවල් කියෙව්වා. පත්තර කියවන අතර ඔවුන් අතර ඇති වූ සංවාද, අතිශයින් නාට්‍යයමයි.

මේ ආකාරයට ඉතාම ඉක්මනින් එකම පත්තරයක් කොටස් හතරකට බෙදුණා. ඉඩ කඩම් දේපළ සහ වෙළඳ දැන්වීම්, ජීවිත ගමනට උපදෙස්, දේශපාලන විවරණ සහ ළමා කොටස. කිසිම නළු නිළියෙකුට තමන් කැමති දේ හැර අනෙක් කොටස් කියවීමට උවමනාවක් තිබුණේ නැහැ. එවුන් හැමෝම තමන්ගේ කොටස් තනි තනිව කියවමින් සතුටු වුණා. ක්ෂණයකින්, පොදු මාතෘකා, පොදු රුචීන් නැති පවුලක් මේ හරහා නිර්මාණය වුණා.

### *3. දර්ශනය ලිවීම*

දර්ශනය නිර්මාණයේ විශාල වැඩ කොටසක් ඩිවයිසින් අභ්‍යාසය තුළින්ම සිදු වී තිබුණා. ඝට්ටනය තීව්‍ර කිරීම සඳහා ආතතිය වැඩි කිරීමත්, දිල් වඩ වඩා හුදෙකලා වන ආකාරය ගොඩ නැගීමත් තමයි එකතු කළ යුතුව තිබුණේ.

දර්ශනය ලිවීමේදී නදී සහ රුවන්ති, තමන්ගේ පවුලේ එකිනෙකා සමඟ බෙදා නොගන්නා තනි තනි බෙදුණු රුචීන් පිළිබඳ අවබෝධ කරගන්නා සහ ඒ ගැන අපහසුතාවට පත්වන එකම චරිතය දිල් බවට පත් කළා. පොදුවේ පවුලේ අයට කතා කළ හැකි කාරණා ඉස්මතු කිරීමේ උත්සහයක දිල් නිරත වෙනවා. නමුත් ඇගේ මේ උත්සහය කිසිවෙකුගේත් සැලකිල්ලට ලක් වෙන්නේ නැහැ.

දිල් අත්විඳින හුදෙකලාව සහ අසම්බන්ධිතතාව මේ හරහා ඉස්මතු වෙනවා. එය කතාව ඉදිරියට තල්ලු කරනවා.

## 4. මේ නාට්‍ය පිටපතේ ඒ දර්ශනය ලියවී ඇති ආකාරය.

***1 වන අංකය, 6 වන දර්ශනය.....***

***සකී දිල් ඉදිරියේ සිටියි.***

**සකී:** අම්මි, අම්මී.

**දිල්:** හ්ම්? ඇයි මොකද?

**සකී:** අම්මි ජර්නලිස්ට් කියන්නෙ කාටද? ජර්නලිස්ට් කියන්නෙ කාටද අම්මී?

**දිල්:** ජර්නලිස්ට්? (මොහොතක්.) ජර්නලිස්ට් කියන්නෙ ලියන කෙනෙක්.

**සකී:** කතා ලියන කෙනෙක්?

**දිල්:** ඇත්ත කතා ලියන කෙනෙක්. ඇයි?

**සකී:** ඊයේ කවුද කෝල් කරා... මි... මි... මිස්... අල්... කියලා ජර්නලිස්ට් කෙනෙක් ගැන ඇහුවා... මිස්... අල්... අල්...

**දිල්:** අල්විස්?

**සකී:** අන්න හරි

**දිල්:** ඉතිං ඔයා මොකද කිව්වෙ?

**සකී:** මං කිව්වා රෝං නම්බර් කියලා

***මොහොතක්.***

**දිල්:** සකී... මං ඔයාගෙ අම්මි වෙන්න කලින්. වෙන අයෙක් වෙලා හිටියා...

***කළණ සහ ගෙදර ආච්චී පිවිසෙති.***

**කළණ** : පත්තර (ඔහු සති අන්ත පත්තර කොටස් එක් එක්කෙනාට බෙදා දෙයි.) අම්මට, දිල්ට, මට...(ඔහු ඉතුරු වූ පත්තර පිටු මේසයේ මැදට විසි කරයි.)

කළණ සහ ගෙදර ආච්චී ඔවුන්ගේ පත්තර පිටු කියවන්නට පටන් ගනිති. දිල් ඇයට ලැබුණු පිටු කියවන්නේ නැත. ඇය සකී දෙසත්, කළණ දෙසත්, ගෙදර ආච්චී දෙසත් මාරුවෙන් මාරුවට බලයි.

**කළණ** : මේ වොච් එකේ ඇඩ් එක දැක්කද? ලස්සනයි නේ?

**ගෙදර ආච්චී** : හ්ම්. කළණ පුතා, ලග්න පලාපල වල හැටියට අද බිස්නස්වලට හොඳයි, හැබැයි වාහන අනතුරු බහුලයි...

**කළණ** : හ්ම්. දිල් මේ සතියේ කැමරාස් වලට හොඳ ඔෆර් එකක් තියෙනවලු. අපි සකීට එකක් ගමුද?

**ගෙදර ආච්චී** : දිල්, සකීට මේ සතිය හරිම අපලයි. අනතුරු සිදුවිය හැකි සතියකි. දරුවා දිහාම ඇහැගහගෙන ඉන්ඩ ඕනෙ...

*කළණ යන්තමින් දිල් දෙස බැල්මක් හෙලයි.*

**කළණ** : ඇයි? කිඩ්ස් ෆන් පේජ් එකේ සකීට වැදගත් මුකුත් නැද්ද?

*දිල් කළණ ඇයට දුන් පත්තර පිටුව දෙස බලයි.*

**දිල්** : පොසොන් ගැන ආටිකල් එකක් තියෙනවා...

**ගෙදර ආච්චී** : ඒක කපලා අරන් තියන්ඩ ඕනෙ. දෙයියනේ මේ බලන්ඩකො එක

පිටුවෙ හොරකං කීයක්ද? ගිනි දවාලේ. නාවලපිටිය. මාකන්දන. කහවත්ත.

*දිල් සකී වෙතට හැරෙයි.*

**දිල් :** හොරකං වැඩිවෙන්න හැමතිස්සෙම මොකක්හරි හේතුවක් තියෙනවා...

**ගෙදර ආච්චී :** මොකද නැත්තෙ, හේතුව තමයි හොරු වැඩි එක.

**දිල් :** ලොකුම හේතුව දුප්පත්කම නේද?

**ගෙදර ආච්චී :** කුස්සියේ දොර වැහුවද?

**දිල් :** ඔව්. (මොහොතක්) කළණ, අද සකී මගෙන් ඇහුවා ජර්නලිස්ට් කියන්නෙ කාටද කියලා...

**කළණ :** ජර්නලිස්ට්? පරිසරය පාඩමටද? (මොහොතක්) අයිසේ මේ අර කැමරා ඇඩ් එක කෙහෙද? මං හිත හිතා හිටියෙ මටත් අලුත් කැමරා එකක් ගත්තොත් හොඳයි කියලා... අතට හොඳට බරට දැනෙන එකක්. අඩුම ගානේ දැක්කම බරයි කියලා හිතෙන එකක්.

**ගෙදර ආච්චී :** මේං තියනවා ජාතික කොඩියේ ෂෝක් පින්තූරයක් සකීට කපලා අරන් තියන්ඩ.

*කළණ සහ ගෙදර ආච්චී තම තමන්ගේ පත්තර පිටු උඩින් පල්ලෙන් බලා අවසන් කර ඇත. ඒ දෙදෙනා ඒවා නවා පැත්තකින් තියා වෙන අලුත් පිටු ගන්නට සූදානම් වෙති.*

**කළණ :** අම්මා, මට ඔය හිටි ඇඩ් එක දාන්න.

**ගෙදර ආච්චී :** පුතා, මට ඔය දහම් අතිරේකෙ දෙන්ඩ.







*ඉහළ වම:*
පත්තර දර්ශනය පුහුණුවෙමින්.
පීටර් ද අල්මේදා සහ නදී
කම්මැල්ලවීර
ඡායාරූපය - පසන් රණවීර

*ඉහළ දකුණ:*
රුවන්ති ද චිකේරා පත්තර
දර්ශනය නරඹමින්.
ඡායාරූපය - පසන් රණවීර

*පහළ වම:*
පත්තර දර්ශනය පුහුණුවෙමින්.
පීටර් ද අල්මේදා, කෞෂල්‍යා
ප්‍රනාන්දු සහ නදී කම්මැල්ලවීර
ඡායාරූපය - පසන් රණවීර



වේදිකා පරිපාලන සහයකයින් පත්තර දර්ශනයට එකතු වෙමින්. ලක්මිණි සෙනෙවිරත්න, පීටර් ද අල්මේදා, කෞෂල්‍යා ප්‍රනාන්දු සහ ශලීනා මුතුමුදලිගේ සමඟ ප්‍රමිල සමරකෝන් සහ ජයම්පති ගුරුගේ. ඡායාරූපය - චානුක තියඹරාවත්ත

*කළණ දිල් වෙතට පත්තර පිටුවක් විසි කරයි.*

**කළණ** : දිල්. ළමා කෑල්ල.

*දිල් කළණ දුන් පිටුව දෙස බලන්නේ නැත. ඒ වෙනුවට ඇගේ අවධානය යොමු වන්නේ මේසය මැද ඇති කවුරුත් අල්ලා නැති පත්තර පිටු වෙතටයි. ඇය ඒ පත්තරයක පිටුවක් යන්තමින් ඔසවා බලයි.*

**දිල්** : මේ අර සීජේට එරෙහි දේශාභියෝගය ගැන ආටිකල් එකක් තියෙනවනෙ...

**ගෙදර ආච්චී** : ළමා කෑල්ලේ?

**දිල්** : නෑ, නෑ...

**කළණ** : දැං කවුරුහරි අර කැමරා ඇඩ් එක හොයනවද?

*දිල් මේසය මැද ඇති පත්තර පිටුවල ඇත්තේ මොනවාදැයි හොඳින් බැලීමට ටිකක් ඉස්සෙයි.*

**දිල්** : අර දඹුල්ලෙ සිද්ධිය ගැනත් ආටිකල් එකක් තියෙනවා.

**ගෙදර ආච්චී** : පුතා - කවද්ද අපිට අර දඹුලු වන්දනා ගමන එක්කං යන්නෙ?

**කළණ** : මගේ අලුත් කැමරා එක ගත්තු ගමං යං...

**දිල්** : මේක හුඟක් හොඳ ආටිකල් එකක් වගේ. අපිට බැරිද මේක...

**කළණ** : කෝ මට ඒක දෙන්න. (ඔහු මෙතෙක් වෙලා කියවමින් සිටි පත්තර

පිටුව නවා පුටුවෙන් නැගිටියි.)

**දිල්** : ඔයාට මේක බලන්න ඕනෙද?

**කළණ** : ඔව්. මට ඒක පෙන්නන්නකෝ...

*ඔහු පැමිණ දිල්ගේ පිටුපසින් හිට ගනියි. ගෙදර ආච්චීත් නැගිට ඔහු අසලට එයි. සකීත් පත්තරේට එබෙයි. දිල් ඒ හැමෝටම පෙනෙන සේ පත්තර පිටුව අල්ලාගෙන සිටියි.*

**කළණ** : මේ තියෙන්නෙ. මේ. මං අර හොය හොය හිටපු කැමරා ඇඩ් එක. ඇයි අප්පා මේවා මේ කවුරුවත් කියවන්නෙ නැති පිටුවල හංගන්නෙ? හොඳ වෙලාවට දිල් අද ඔයා මේක අතට ගත්තෙ. බලන්න? මේක මට අරගෙන මේක සකීට ගන්න පුළුවන් - මේ පුංචි රෝස පාට එක. කියුට් නේ? දැක්කද අම්මා?

**ගෙදර ආච්චී** : අනේ! ඒ පින්තූරෙ ඉන්න දරුවා අපේ සකී දූ වගේමයි නේද?

**කළණ** : අපේ සකීගෙ ෆීචර්ස් මීට වඩා ෂාප්. නැද්ද? ජර්නලිස්ට් කෙනෙක් විදියට ඔයා මොකද කියන්නෙ දිල්? ඔයා හිතන්නැද්ද අපේ සකීගෙ ෆීචර්ස් මේ ළමයට වඩා ෂාප් කියලා?

*සියලු දෙනාම පත්තරේ දෙස බලා ගෙන සිටිති. එය නිශ්චල ඡායාරූපයක් වැනිය. දිල් එයින් මිදී එළියට ඇවිත්, තමන්ගේ පවුල දෙස බලා සිටියි.*

**දිල්:** සකී, සකී. මම කවුද?

**සකී:** ඔයා මගේ අම්මා.

**දිල්:** මගේ නම මොකක්ද?

**සකී:** අම්මී.

**දිල්:** අම්මි අන්තිමට බලපු නාට්‍ය මොකක්ද?

**සකී:** තොප්පි වෙළෙන්දා.

**දිල්:** අම්මි අන්තිමට කියවපු පොත මොකක්ද?

**සකී:** උඩ ගිය බබා. අම්මි ඒක මට කියෙව්වා....

**දිල්:** අම්මි අන්තිමට බලපු ෆිල්ම් එක මොකක්ද?

**සකී:** කුන්ෆු පැන්ඩා !

**මොහොතක්.**

**දිල්:** සකී, අම්මී ඩාන්ස් කරන්නෙ කොයි වෙලාවටද?

**සකී:** ඔයා ඩාන්ස් කරන්නෙ නෑ!

**දිල්:** අම්මි සිංදු කියන්නෙ කොයි වෙලේද?

**සකී:** ඔයාට තරහා ගියාම. හෝම්වර්ක් කරන වෙලාවට....

**දිල්:** සකී අම්මිගෙ ඔළුව කොහෙද තියෙන්නෙ?

**සකී:** තාමත් ෆිල්ම් ආච්චා එක්ක නේද?

**මොහොතක්.**

**දිල්:** ඔයාට එයා කියපු දේ ඇහුණා නේද පැටියෝ?

**සකී:** මට ලියන්න.... මී... මට ලියන්න.... හැමදාම... මී....

**සකී නවතියි. ඇය බෑගය ඇර, ෆිල්ම් ආච්චාගේ මේකප් කාමරයේ මේසය මත තිබී, ගත් ඡායාරූපය එළියට ගනියි. දිල් වෙතට ඇවිද යන ගමන්, එහි ලියා ඇති දෙයක් හඬ නගා කියවයි.**

**සකී:** මට ලියන්න හැමදාම
ඔයා නැතුව මට පාළුයි.
ඔයා කවුද කියලා මට මතක් කරලා දෙන්න. මට අමතක වෙමින් යනවා.

ඔයා වටේ ඉන්න අනිත් හැමෝටමත් අමතක වෙලා වගේ. එතකොට ඔයාගෙ දරුවො, ඔයාගෙ දරුවො කවදාවත් දැනගන්න එකක් නෑ....

**මොහොතක්. දිල් ජායාරූපය දෙස බලයි. සකී කියවන වදන් පෙළ දෙස බලයි.**

**සකී:** ඔයා දැං කවුද අම්මී? ඔයා දැං කවුද?

**මොහොතක්.**

**දිල්:** මං දන්නෑ....

**සකී සිනාසෙයි.**

**සකී:** ඔයා දන්නෑ?

(උපුටා ගැනීම - කලුමාලි වැඩිහිටියන්ට සුරංගනා කතාවක් - 1 වෙනි අංකය. 6 වෙනි දර්ශනය)

අධ්‍යයන ගොනුවේ මේ කොටසින් අපි විමසා බැලුවා, කලුමාලි නාට්‍යයේ ඝට්ටනය නිර්මාණය කිරීම සඳහා ඩිවයිසින් ක්‍රමවේදය හැසිරුවේ කෙසේද කියා. එසේම නාට්‍යයේ ප්‍රධාන චරිතය වන දිල්ගේ ජීවිතය තුළ ඝට්ටනයන් ගොඩ නැගීමට අත්පිටපතින් සොයාගත් මූලාශ්‍ර ඩිවයිසින් ක්‍රමය හරහා අවස්ථා සහ සිදුවීම් හැටියට ගොඩ නැගුවේ කෙසේද කියා. මේ ඝට්ටනයන් ගොඩනැගිමේදී හැමවිටම පිටපත් රචකයන් Passing Stage අත්පිටපත දෙසට මුලින්ම හැරුණා. ඊට එහා තව දුර යාමට අවශ්‍ය වූ විට අපි අලුතින් අමුද්‍රව්‍ය පිටින් ගෙනාවා. ඊට පසුව ඒවා නළු නිළි කණ්ඩායමට ලබා දී ඩිවයිසින් තුළින් දර්ශන බවට පත් කළා.

රුවින් ද සිල්වා කලුමාලි
ප්‍රචාරණ රූගතකිරීම්වලදී.
ඡායාරූපය - පසන් රණවීර



## *කලුමාලි නිර්මාණය කළේ සැබෑ ජීවිතයේ ආදර්ශී චරිත තුළින්*

**ඩිවයිසින් ක්‍රියාවලියකදී මෙන්ම ජීවිතයේද ඇති විශේෂත්වය වන්නේ අප කිසිසේත්ම අපේක්ෂා නොකරන මොහොතක අප වෙත අභියෝග එල්ල වීමයි. බොහෝ විට මේ අභියෝග එල්ල වන අවස්ථාවේදී අපට ඒවායේ වටිනාකම තේරුම් ගන්නට අපහසුයි. ඒවායේ අගය අවබෝධ කරගන්නට කාලයක් ගතවෙනවා.**

**පුහුණුවීම් කාමරය තුළ නිර්මාණය කළ ඝට්ටනයන් සහ අත්හදා බැලීම් තුළින් කලුමාලි ගොඩනැගීමට ශිල්පීන් කණ්ඩායම වෙහෙස නොතකා වැඩ කළා.**

**කෙසේ වෙතත් කලුමාලිගේ කළු මැජික් බලය විසින් ඔවුන්ව අලුත් අභියෝගයන් සහ බාධකයන් වෙතට තල්ලු කර දමන්නට නියමිත බව ඔවුන් දැන සිටියේ නැහැ. කණ්ඩායමක් හැටියට නාට්‍යයයේ පැවැත්ම අවදානමට හෙළන ප්‍රධාන පසුබෑම් දෙකක් ඔවුන්ට අභිමුඛ වීමට ආසන්නව තිබුණා. එසේම මේ පසුබෑම් දෙක තුළින්, නාට්‍ය කණ්ඩායම අතරින්ම සැබෑ ජීවිත ආදර්ශ දෙකක් ඉස්මතු වීමට නියමව තිබුණා.**

කලාකරුවන් කණ්ඩායමට මුහුණ දෙන්නට සිදු වූ සැබෑ ජීවිතයේ සිද්ධීන් මොනවාද යන්න විමසා බැලීමට පෙර කලුමාලි නාට්‍යයේ නළු නිළි කණ්ඩායම හඳුනාගනිමු.

## *නළු නිළි කණ්ඩායම*

| | |
|---|---|
| **දිල්** | ලක්මිණි සෙනෙවිරත්න<br>නදී කම්මැල්ලවීර |
| **කළණ** | පීටර් අල්මේදා<br>මිරංග ආරියරත්න |
| **ගෙදර ආච්චි** | කෞශල්‍යා ප්‍රනාන්දු |
| **ෆිල්ම් ආච්චා** | ජුවනිටා බීලිං |
| **සකී** | ශෙලීනා මුතුමුදලිගේ/සහලා අනීස් |
| **නාඳුනන මිනිසා** | ගිහාන් ද චිකේරා/ධනුෂ්ක ඩයස් |
| **බඩදරූ අම්මා** | ෂෙනාලි රාජ්කුමාර් |
| **ෆිල්ම් ආච්චාගේ කලුමාලි** | මල්ශානි දෙල්ගහපිටිය |
| **දිල්ගේ කලුමාලි** | නදී කම්මැල්ලවීර<br>ලක්මිණි සෙනෙවිරත්න |
| **ගෙදර ආච්චිගේ කලුමාලි** | ජයම්පති ගුරුගේ |
| **නාඳුනන මිනිසාගේ කලුමාලි** | ජුවනිටා බීලිං සහ වේදිකා සහයක කණ්ඩායම |

## පළමුවෙනි ජීවන ආදර්ශය

### ෆිල්ම් ආච්චා (අයිරාංගනී සේරසිංහ)

ෆිල්ම් ආච්චාගේ චරිතය ලියවුණේ ඇයටමයි.

අයිරාංගනී සේරසිංහ යනු ශ්‍රී ලංකාවේ සිටින අතිශයින්ම ගෞරවනීය, ජ්‍යේෂ්ඨතම, ප්‍රවීණතම කලාකාරිනියයි. සිනමා නිළියක් හැටියට ඇගේ ප්‍රතිභාවේ ප්‍රභාව අගයමින්, ඇගෙන් ආදර්ශ ලබා ගනිමින් හැදුණු වැඩුණු පරම්පරාවකට ඇය වූ කලී දක්ෂතා පමණක් නොව ඥානයෙන්ද කාරුණික බවින්ද අනූන සුවිශාල මනුෂ්‍යයෙක්. ඇයව ඇසුරු කරන්නට වාසනාව ලද අය, ඇගේ නිදහස්කාමී ආත්මය, අසීමිත ධෛර්යය සහ ශක්තිය පිළිබඳව දන්නවා. අයිරාංගනී සේරසිංහ නොබියව, නිදහසේ ඉහළ අහසේත්, ගැඹුරු වනාන්තරවලත් සැරිසැරූ ගැහැණියක්.

කලුමාලි හි ෆිල්ම් ආච්චාගේ චරිතය නිදහස් ආත්මයක් දරාගත් තෘප්තිමත් ජීවිතයක්. අනිත් අය නොයන මං වල ගමන් කරන්නට ඇය තුළ අසමාන විශ්වාසයක් සහ ශක්තියක් තිබුණා. සමාජයේ බහුතරයක් දෙනා කරන වැරදිම කරමින් එමගින් ලැබෙන සුරක්ෂිතතාව පිටුපස සැඟවෙන්නේ නැතිව, ඒ වෙනුවට තමන්ගේම වැරදි කිරීම ඇය තෝරාගත්තා.

අයිරාංගනී සේරසිංහ යනු පණ පෙවූ ෆිල්ම් ආච්චායි. තමන්ගේම පාරක තමන්ගේම ගමන් ගිය, තමන් උපන් යුගය ඉක්මවා ගිය ගැහැනියක්. ශක්තිය සහ කාරුණික බව වෙනුවෙන් අති මහත් ආදරයට සහ ඇගයීමට ලක් වුණු ස්ත්‍රියක්.

අයිරාංගනී සේරසිංහ මහත්මියව කලුමාලි වෙනුවෙන් තේරීම නිර්භය තීන්දුවක්. ඇය සිය රංගන ජීවිතය ඇරඹුවේ වේදිකාවෙන් වුවත්, ඒ වන විට ඇය දශක ගණනාවකින් වේදිකාව ඇසුරු කර තිබුණේ නැහැ. ඒ කාලය තුළ ඇගේ ප්‍රධාන මාධ්‍ය වී තිබුණේ සිනමා සහ ටෙලි තිරයයි. කෙසේ වෙතත්, අයිරාංගනී සේරසිංහ මහත්මිය ෆිල්ම් ආච්චා චරිතය රඟපාන්නට බාරගත්තා පමණක් නොව, වේදිකාවට නැවත පිවිසීමට ලැබුණු අවස්ථාව පිළිබඳව අමන්දානන්දයට පත් වුණා.

අයිරාංගනී සේරසිංහ ෆිල්ම් ආච්චාගේ
චරිතය සඳහා පුහුණුවෙමින්.
ඡායාරූපය - පසන් රණවීර



එයින් කලුමාලිට ලැබුණු වටිනාකම අති මහත්. මේ සුවිශේෂී මොහොත උදාවන තුරු ශ්‍රී ලාංකික ප්‍රේක්ෂාගාරයද අපේක්ෂා දල්වාගෙන බලා සිටියා.

පුහුණුවීම් කාලයේදී අයිරාංගනී සේරසිංහ මහත්මිය නාට්‍යය සහ කණ්ඩායම සමඟ විශාල ලෙස බැඳුණා. තරුණ කලාකරුවන්ට ඇය වැනි සැබෑ ජීවන ආදර්ශයක් සමඟ සමීපව වැඩ කරන්නට ලැබීම මහත් භාග්‍යයක් වුණා. ඇය සමඟ කතා කිරීමෙන් සහ ඇය ටිකෙන් ටික තමන්ගේ චරිතය වියා ගන්නා ආකාරය බලා සිටීමෙන් ඔවුන් බොහෝ දේ ඉගෙන ගත්තා. කොයිතරම් පරිණත නිළියක් වුවත් ඇය ෆිල්මි ආච්චාගේ චරිතය ගොඩ නගා ගැනීමේදී බෙහෙවින් වෙහෙස වී වැඩ කළා. ඇය එය අතිශය බැරෑරුම් වගකීමක් ලෙස බාරගෙන තිබුණා

ඇගේ නිවසේ පැවැත්වූ පුහුණුවීම්, සමස්ත නළු නිළි කණ්ඩායමට අසිරිමත් අත්දැකීමක් වුණා. කණ්ඩායමේ එකිනෙකා අතර බැඳීම වර්ධනය වීමටත් එය බලපෑවා.

කලුමාලි, සුන්දර ආශිර්වාදයන් මැද සුබ මොහොතින් මෙලොව එළිය දකින්නට සූදානමින් සිටියා.

නමුත්, මංගල දර්ශනයට සති දෙකක් තිබියදී අයිරාංගනී සේරසිංහ මහත්මිය හදිසියේ රෝගාතුර වී රෝහල් ගත කළා

කලුමාලි හිටි තැනම ගල් ගැහුණා!

නළු නිළි කණ්ඩායම මහත් සේ වික්ෂිප්තභාවයකට පත් වුණා.

අයිරාංගනී සේරසිංහ මහත්මියගේ අනුභාසාත්මක පෞරුෂත්වය වෙතින් ඔවුන් විශාල බලපෑමක් සහ ආභාසයක් ලබමින් සිටියේ. කණ්ඩායමේ ශිල්පිනියකට එහා ගිය විශාල බලපෑමක් ඇය වෙතින් සමස්ත වෘන්දයට ලැබී තිබුණා. ඇය සැබෑ ජිවිතයේ ෆිල්මි ආච්චා! කලුමාලි කතාන්දරයේ සමස්ත ශක්තිය ගොනු වී තිබුණේ එතැන!

නමුත්, තවදුරටත් කණ්ඩායමේ සිටියේ නැති වුවත්, අයරාංගනී ආන්ටී, ඔවුන්ට දිගින් දිගටම ශක්තිය ලබා දුන්නා. රෝහලේ සිටිමින් ඇය කණ්ඩායමට අවවාද සහ ජවය එව්වා. අවිනිශ්චිතතාව යනු වේදිකාවටත් ජීවිතයටත් එකසේ ආවේණික ලක්ෂණයක් බව ඇය කණ්ඩායමට මතක් කර දුන්නා. අපි

වේදිකාව තෝරාගෙන සිටින්නේ ජීවිතයේ අවිනිශ්චිතතාව, පරිත්‍යාගය සහ අභියෝග බාර ගැනීමට තෝරාගෙන ඇති නිසා බව ඇය අවධාරණය කළා.

ඒ ඇය වෙතින් එල්ල වුණු අණක් සහ ඉල්ලීමක්! ඇගේ දේව දුව කලුමාලි, හිස කෙළින් තියාගෙන ඉදිරියටම ගමන් කළ යුතු බවත්, නාට්‍ය දර්ශන දින සැලසුමට කිසිදු වෙනසක් නොකළ යුතු බවත් ඇය දැඩිව කියා සිටියා.

ඇගේ පැත්තෙන්, යළි වේදිකාවට පැමිණීමේ දිගු කලක් දකිමින් සිටි සිහිනය අත්හැර දැමීමට ඇය සූදානම්ව සිටියා. නාට්‍යය වෙනුවෙන් බොහෝ වෙහෙස වී වැඩ කළත්, ඒ අවස්ථාව තමන්ට අහිමි එකක් බව ඇය සාමකාමීව බාර ගෙන තිබුණා.

කෙසේ නමුත් මංගල දර්ශනය දා ප්‍රේක්ෂාගාරයේ මුල් පෙළේ අසුනක වාඩි වී සිටින බවට ඇය කණ්ඩායමට පොරොන්දු වුණා.

අයිරාංගනී ආන්ටී නැතිව කලුමාලි නාට්‍යය කරන්නේ කෙසේදැයි මුලින්ම නළු නිළි කණ්ඩායමට සිතා ගත නොහැකි වුණා.

නාට්‍යයේ ප්‍රචාරක කටයුතු සියල්ල කේන්ද්‍ර වී තිබුණේ දශක ගණනාවකට පසු අයිරාංගනී සේරසිංහ කලාකාරිය වේදිකාවට පැමිණීම කියන සංකල්පය වටා. මේ සියල්ලටම වැඩිය, ඇය අපේ සැබෑ ජීවන ආදර්ශය, ෆිල්ම් ආච්චා!

කෙසේ වෙතත්, ඇය නැතිව පුහුණු වීම් දිගටම කරගෙන යාමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය එකතු කර ගත යුතු බව ඇය කියා සිටියා

අවසානයේ කෙසේ හෝ අප එය කළා. ඇය වෙනුවෙන් අප එය කළ යුතු වුණා.

වාසනාවකට, පළවෙනි පුහුණුවීම් දිනයේ පටන්ම අයිරාංගනී ආන්ටී කරන කියන සියලු දේ සාවධානව නිරීක්ෂණය කළ දක්ෂ නිළියක් අප අතර සිටියා. ඒ ප්‍රවනිටා බීලිං. ඇය අයිරාංගනී ආන්ටී සමඟ මාස ගණනක් තිස්සේ ඉතා සමීපව වැඩ කර තිබූ අතර, ඇගේ රංගනයේ සාරය සැලකිය යුතු මට්ටමකට අවශෝෂණය කරගෙන තිබුණා.

අපි නැවතත් පුහුණුවීම් ආරම්භ කළා. හෙමින් හෙමින් කලුමාලි ආපසු නැගී සිටියා.

## දෙවන ජීවන ආදර්ශය

**සකී (සහලා අනීස්)**

අපිට සකීගේ චරිතය සඳහා ළමා රංගන ශිල්පීන් දෙපළක් සිටියා. ශලීනා මුතුමුදලිගේ සහ සහලා අනීස්.

මේ දෙදෙනාම අවුරුදු 10 ක පමණ දැරිවියන්. දෙදෙනා තුළම වේදිකාව පිළිබඳ විශාල ආසාවක් සහ උනන්දුවක් තිබුණා. එසේම දෙදෙනාම වරින් වර විවිධ අවස්ථාවල රංගනය පිළිබඳ අත්දැකීම් ලබා තිබුණා. මොවුන් දෙදෙනාම සකීගේ චරිතය වෙනුවෙන් මහත් වෙහෙස වී සූදානම් වෙමින් සිටියා. ඇත්තටම කණ්ඩායමේ සිටි වැඩිහිටි ශිල්පීන්ට, මේ කුඩා නිළියන් දෙදෙනාගේ කැප වීම සහ වෘත්තීයමයභාවය එක්තරා ආකාරයක අභියෝගයකුත් වුණා!

නාට්‍ය කණ්ඩායමේ මේ සුන්දර දැරිවියන් දෙදෙනා සිටීම අසිරිමත් අත්දැකීමක් වුණා. ඔවුන් දෙදෙනා ඉතා හොඳින් එකට එක්ව වැඩ කළා. මුල් කාලයේදීම තීරණය කෙරුණා සහලා සිංහල නිෂ්පාදනයේ සකී රඟපාන බවත්, ශලීනා ඉංග්‍රීසි නිෂ්පාදනයේ සකීගේ චරිතය රඟපාන බවත්.

මේ දෙදෙනාම තමන්ගේ ජීවිතයේ ප්‍රථම ජාතික නිෂ්පාදනය වෙනුවෙන් නොඉවසිල්ලෙන් බලා සිටියා. ඔවුන් කිසි දවසක පුහුණුවීම් මග හැරියේ නැහැ. අනිත් නළු නිළියන් සේම ඔවුන්ද දිවා රෑ නොබලා පුහුණුවීම් කළා.

කෙසේ වෙතත්, රංග වස්ත්‍ර සහිතව කළ පුහුණුවෙන් පසුව, නාට්‍ය නිර්මාණයට දායක වීම සහලාට තහනම් වුණා.

අපිට සහලාගෙන් පණිවුඩයක් ලැබුණා පමණයි! ඇයට අඩු තරමින් නාට්‍යය බලන්නට එන්නට වත් හැකි වුණේ නැහැ. අපි ඇයව එදායින් පසුව දැක්කේ නැහැ.

එය නාට්‍ය කණ්ඩායමට දරා ගත හැක්කක් වුණේ නැහැ. නමුත් අප ඇය නැතිව නාට්‍යය කළ යුතුව තිබුණා. අපේ අනිත් කුඩා නිළිය, ශලීනා එක දවසක

සහලා අනීස් පුහුණුවීම්වලදී
ඡායාරූපය - පසන් රණවීර



පුහුණුවීමකින් පසුව, සිංහල නිෂ්පාදනයේද රඟපාන්නට ඉදිරිපත් වුණා!

සහලා ඇය බෙහෙවින්ම ආදරය කළ වේදිකාවෙන් සෑහෙන කාලෙකට ඉවත් වුණා.

අපි සිතුවා ඒ ඇගේ කතාවේ අවසානයයි කියා. නමුත් කලුමාලි කතාන්දරයේ සේම අවුරුදු ගණනාවකට පසු තමන්ගේ තීරණ තමාටම ස්වාධීනව ගත හැකි, ශක්තිමත් යෞවනියක හැටියට සහලා යළිත් මිනිසුන් අතරට ආවා.

කලුමාලි කතාන්දරයේ වගේම සහලා, තමාට තමන්ගේ ජීවිතය සහ ඉරණම පිළිබඳ තීරණ ගැනීමට ශක්තිය ලැබෙන තුරු, අතිශය ඉවසීමෙන් සියල්ල දරාගෙන සිටියා.

**අනපේක්ෂිතව අප හමුවට ආ පසුබෑම් දෙකක් අපට නාට්‍ය දර්ශනයකට එහා ගිය ජීවිතය සහ කලාව පිළිබඳ වටිනා පාඩම් කියා දුන් හැටි අපි කතා කළා. මේ අභියෝගයන් දෙක ජීවිතය සහ කලාවට සැබෑ ජීවන ආදර්ශයන් දෙකක් බිහි කළා.**

**ඒ ආදර්ශ චරිත දෙක බවට පත් වුණේ අපේ කණ්ඩායමේ සිටි වැඩිමහල්ම සහ ලාබාලම ශිල්පීන් දෙදෙනා වීම තවත් ආශ්චර්යයමත්. ඉතිං සිදුවේයැයි අනුමාන කළ හැකි අභියෝග පමණක් නොව නාට්‍යයේ පැවැත්මට තර්ජනය කළ අතිශයින්ම අනපේක්ෂිත බාධාවන් වලටද මුහුණ දෙමින්, කණ්ඩායමේ ශක්තිය, ධෛර්යය සහ ඉවසීම තුළින් ඒවා ජයගැනීමට හැකි වීම කලුමාලි ලැබූ ආශිර්වාදයක්.**

**කලුමාලිට, සැබෑ ජීවන ආදර්ශ වල ආශිර්වාදය ලැබී තිබුණා.**

සහලා අනීස් සහ අයිරාංගනී සේරසිංහ සකී සහ
ෆිල්ම් ආච්චාගේ චරිත පුහුණුවෙමින්.
ඡායාරූපය - පසන් රණවීර





# කලුමාලිගේ වර්ණ, ආලෝකය සහ සංගීතය

**මේ වන විට කලුමාලි මෙලොව එළිය දකින්නට සියල්ල සූදානම් වී තිබුණා.**

**පුහුණුවීම් කාමරයේ ඇයව ගොඩ නැගූ ශිල්පීන් කළේ ඇගේ චරිත සහ කතාව ගොඩනැගීම පමණක් නොවේ. ඇගේ පෙනුම, ඇයව ආලෝකයෙන්, සංගීතයෙන් සහ රංග වස්ත්‍රවලින් සරසන ආකාරයත් ඔවුන් නිර්මාණය කර තිබුණා.**

**කලුමාලි හි වේදිකා සැලසුම් නිර්මාණ පිළිබඳව මේ කොටසින් කතා කරමු.**

**වේදිකා සැලසුම් නිර්මාපකයාගේ සටහන් වෙතින් උපුටා ගත් පහත දැක්වෙන සටහනින් කලුමාලිගේ මැජික් ලෝකය වේදිකාව මත නිර්මාණය කරන්නට අප ගත් උත්සාහය පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිවේවි.**

## පසුතල නිර්මාණය

කලුමාලි හි වේදිකා පසුතලය නිර්මාණය කළේ, සාමාන්‍ය ගෘහ ලෝකයේ සිට සුරංගනා කතාවල මැජික් ලෝකය දක්වා පහසුවෙන් පරිවර්තනය කළ හැකි ආකාරයට. සැබවින්ම, සුරංගනා කතාවල මායාමය ස්වභාවයට ගැළපෙන ආකාරයට සුපුරුදු දෛනික ජීවිතයේ පැවැත්මේ සිට ෆැන්ටසි ලෝකය දක්වා සංක්‍රමණය වීම රංගයට ඈඳා තිබුණු අතර පසුතලය නොදැනුවත්වම මෙන් සිදුවන මේ සංක්‍රාන්තියට සහය දිය යුතු වුණා.

## වේදිකා පසුතල සහායකයින්

සජීවි රංගයක් තුළ පසුතලයේ මේ මැජික් සංක්‍රාන්තිය යථාර්ථවත් කරන්නට පිටුවහල් වුණු අංගයක් වූයේ වේදිකා පසුතල සහායකයින් සහ පසුතල වෙනස් කිරීම ප්‍රධාන කතාන්දරයේ සිදුවීම් සමඟ ඒකාබද්ධ කිරීමයි. පසුතල වෙනස් කිරීම කළේ ප්‍රේක්ෂකයන්ට හොඳින්ම පෙනෙන පරිදි. එය ඒ මොහොතේ වේදිකාව මත සිදුවන රංගයට අත්‍යන්තයෙන්ම සම්බන්ධ වුණා. පසුතල සහායකයින් වේදිකාව මත නළු නිළියන් සමඟ සහ සම්බන්ධතාවක් පැවැත්වූ අතර රංගයේ මනෝභාවයට, ක්‍රියාවට සහ සංගීතයට අනුකූල රිද්මයකින් තමයි පසුතලය එහා මෙහා කිරීම හෝ ඉවත් කිරීම සිදු කළේ. මේ හරහා, දර්ශනයක් අඛණ්ඩව ඉතා සියුම්ව සුමටව අනිත් දර්ශනය වෙත ගලා යෑමට සැලැස්වීමට හැකි වූ අතර, ඇතැම් දර්ශනයක මුල සිට අග දක්වාම ක්‍රම ක්‍රමයෙන් පසුතලය වෙනස් කිරීමේ අවස්ථා පවා තිබුණා.

වේදිකා පරිපාලන සහයකයින් පසුතල හුවමාරුවක් රඟදක්වමින්. මල්ෂානි දෙල්ගහපිටිය, ප්‍රමිල සමරකෝන්, ජයම්පති ගුරුගේ සහ ධනුෂ්ක ඩයස්

ඡායාරූපය - චානුක තියඹරාවත්ත



## කලුමාලි සුරංගනා කතා පහ

කලුමාලි නාට්‍යයේ ආකෘතිය සකස් වී ඇත්තේ සකී නමැති කුඩා දරුවාට ඇගේ මව (දිල්), පියා (කළණ), පියාගේ මව (ගෙදර ආච්චී), මවගේ මව (ෆිල්ම් ආච්චා) සහ නන්නාඳුනන මිනිසෙකු විසින් කියන සුරංගනා කතා පහක් ඇසුරින් බව අපි මේ වන විටත් දන්නවා.

ඒ සැම සුරංගනා කතාවක්ම එය කියන වැඩිහිටියාගේ ලෝක දැක්ම, පෞරුෂත්වය සහ මානසික තත්ත්වය නිරූපණය කළා. නාට්‍යයේ පසුතල නිර්මාණයේදී මෙය සාක්ෂාත් කර ගත් ආකාරය පිළිබඳ අදහසක් ලබා ගැනීමට මේ සටහන් ප්‍රයෝජනවත් වේවි.

***ෆිල්ම් ආච්චාගේ කලුමාලි කතාන්දරය:*** මෙය කතාවේ එන පළවෙනි සුරංගනා කතාව. එය සකීට කියන්නේ අසම්මත ජීවිතයක් ගෙවන, ක්‍රියාශීලි, වයස්ගත නිළියක් වන දිල්ගේ අම්මා, ෆිල්ම් ආච්චී විසින්. ගැහැණු සහ පිරිමි ස්වභාවයන් සහ ශක්තීන් දෙකම එකවර පාවිච්චි කිරීමෙන් මැජික් මවන්නට හැකි බව කියවෙන මේ කතාව තුළින්, ෆිල්ම් ආච්චා විසින් නිර්මාණය කරන කලුමාලි චරිතය ගොඩනැගෙනවා.

ෆිල්ම් ආච්චාගේ සුරංගනා කතාව කියද්දී වේදිකාව හිස්. සමස්ත අවධාරණය යොමු වී ඇත්තේ, නිළියගේ ශරීරය කෙරෙහි- ගැහැණියක් හෝ පිරිමියෙක් හෝ වීමට ශක්‍යතාව ඇති ශරීරය කෙරෙහි. රංගය සිදුවෙන්නේ එක් තනි ආලෝක ධාරාවක් යට. ඇගෙන් ඉදිරිපස වේදිකාවේ කොටසට පමණක් ඒ ආලෝකය වැතිරී තිබෙනවා. දර්ශනයේ පසුතල නිර්මාණය විසින් අවධානය මුළුමනින්ම රංග ශිල්පියා වෙතත් කලුමාලි සුරංගනා කතා මාලාවේ ආරම්භය වෙතත් ලබා දී තිබුණා.

නාට්‍යයේ පළවෙනි දර්ශනය බැවින්, මේ කතාන්දරය වේදිකාව මත කලුමාලි අන්දරයට උත්පත්තිය දෙන අවස්ථාවයි.

*දිල්ගේ කලුමාලි කතාන්දරය* දිල් යනු මාතෘත්වය සම්බන්ධයෙන් උගුලක අසුවුණු, ව්‍යාකූල මානසික ස්වභාවයක සිටින්නියක්. තමන්ගේ අම්මා ඇයව හදා වඩා ගනිද්දී අනුගමනය කළ අසම්මත ප්‍රවේශය ගැනීමට ඈ තුළ ආත්ම විශ්වාසයක් නැහැ. ඒ නමුත් සාම්ප්‍රදායික අම්මාගේ භූමිකාව සමඟ ඇය අරගල කරනවා. දරුවා පිළිබඳ අසීමාන්තික වගකීම් වලින් බරවුණු දිල්ගේ

කලුමාලි කතාන්දරය උපදින්නේ සකීගේ නිදන කාමරය තුළ, මවක් දිනපතා මුහුණ දෙන වෙහෙසකාරී දෛනික ගෙදරදොර වැඩ කටයුතු මැද. කලුමාලි කතාවේ මැජික් බලය විසින් සාමාන්‍යය, ආසාමාන්‍ය බවට පරිවර්තනය කරනවා. මේ නිසා සකීට කලුමාලි කතාන්දරය කියන අතර ඇගේ නිදන කාමරය සහ එහි ඇති සියලු සාමාන්‍ය බඩු භාණ්ඩ සහ ඇය අතින් ඉටු විය යුතු වැඩ සියල්ල මැජික් ලෝකයක් බවට පෙරළෙනවා.

මදුරු දැල රන්වන් පාට කුඩා පැලක් බවට පත්වෙනවා. රෙදි වැටේ එල්ලා ඇති කුඩය මැජික් අඹ ගහක් බවට පත් වෙනවා. ඇඳ මත නවන්නට දමා ඇති රෙදි ගොඩ, දම්පාට කන්ද බවට පරිවර්තනය වෙනවා.

එදිනෙදා සාමාන්‍ය ලෝකය සිහින ලෝකයක් බවට පරිවර්තනය වෙන මේ ක්‍රියාවලිය තුළ, දිල් තම දරුවාගේ  ලෝකය තුළ තමන්ගේ සිහින සඟවාගෙන, සිරකරගෙන  සිටින ආකාරය අපට දැනවෙනවා.

***ගෙදර ආච්චීගේ කලුමාලි කතන්දරය:*** ගෙදර ආච්චී කියන්නේ දිල්ගේ අම්මා. ෆිල්ම් ආච්චී අසම්මත වෙන තරමටම ඇය ගතානුගතිකයි. තමන්ගේ පුතා සහ ලේලිය සමඟ ජීවත් වන ඇය, ඇයට දැනෙන පවුලේ ඇති අතෘප්තිය පිළිබඳව නිරන්තර තැති ගැන්මකින් සිටියි.  තමන්ගේ පුතා ගේ පවුල ඇතුලේ තමන් අතිශය නොවැදගත්, කුඩා චරිතයක් වී ඇති ආකරයයි ඇගේ කලුමාලි කතාන්දරය තුළින් පිළිබිඹු වෙන්නේ.

මේ නිසා කූඹියෙකු ලෝකය දකින ආකාරය නිරූපණය වන විදියට තමයි වේදිකා පසුතලය සහ රංග භාණ්ඩ නිර්මාණය කළේ.

යෝධ සබන් පෙට්ටියක් සහ යෝධ දත් බුරුසුවක් අස්සේ ජීවත්



වෙන, හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන කුඩා කූඹිච්චි ඇගේ ලෝකයේ යෝධයන්ව ආරක්ෂා කිරීමට වැර වීරිය ගන්නවා. ඇය යෝධ බත් ඇට, යෝධ සීනි ඇට උස්සාගෙන ගොස් ගබඩා කරනවා.

රංග භාණ්ඩ වල විශාලත්වය සහ දාඩිය හෙළාගෙන වෙහෙස වී වැඩ කරන කූඹිච්චි මගින් දවස පුරාම, කවුරුත් අගය නොකරන පුංචි පුංචි කාරුණික උදව් පවුලේ අය වෙනුවෙන් කරමින් කාටත් නොපෙනී, බයෙන් තැතිගැන්මෙන් දවස ගෙවන දිල්ගේ නැන්දම්මාගේ අත්දැකීම පිළිබිඹු වුණා. තමන් රැක බලා ගන්නා යෝධයන් මහා විනාසයක් දෙසට යමින් සිටින බවත්, ඒ මගින් ඇයත් ඇතුළු සියලු දෙනාම නැසී යනු ඇති බවටත් ඈ තුළ විශාල භීතියක් තිබුණා.

***කළණගේ කලුමාලි කතන්දරය:*** කළණගේ කලුමාලි කතාවේ කේන්ද්‍රය වන්නේ ඇගේ දියණියට හුරු පුරුදු සුරංගනා කතා කියන සම්ප්‍රදාය ගැන ඔහුගේ නොදැනුවත්කමයි. තමන්ගේ බිරිඳ කිසිදු හේතුවක් නොකියාම හදිසියේම නිවසින් ගොස් ඇති වේලාවක, එයින් ව්‍යාකූල වී සිටින කළණ, සකී ඉල්ලා සිටින කලුමාලි කතාව කුමක්දැයි කිසිදු අවබෝධයකින් තොරව කලුමාලි කතන්දරයක් වෙනුවට බොබ් මාලේ ගැන කතාවක් ඇයට කියන්නට පටන් ගනියි.

සකීට කෑම හදා දෙන්නට අසීරු උත්සහයක් ගනිමින් - සමහරවිට මේ ඔහු ජීවිතයේ එය කරන පළමුවෙනි අවස්ථාව විය හැකියි - බොබ් මාලේ ගැන කතන්දරයක් කියන්නට හදන කළණ ගේ ව්‍යාකූලබව සහ අපහසුතාව ඉස්මතු වෙන පරිදි පසුතලය නිමවන ලදි. සකීට සැන්ඩ්විච් එකක් හදා දෙන්නට උත්සහ කරන කළණට අදාළ බඩු තියෙන්නේ කොහේද කියා සොයාගනන්ට

*කූඹිච්චි කලුමාලී යෝධයන්ගේ ලෝකයේ*
*ජීවත් වෙයි. ජයම්පති ගුරුගේ*
ඡායාරූපය - චානුක තියඹරාවත්ත

බැරිය. සකීට අම්මා නැති පාළුව දැනෙන එක වළක්වන්නට උපරිම උත්සහ ගන්නා කළණගේ අවුල සහ අපහුසතාව වැඩි කිරීමට පසුතල කණ්ඩායම දර්ශනය ආරම්භයේදී කුස්සියේ බඩු තියන සුපුරුදු තැන් වෙනස් කළා.

ඔහුගේ සුරංගනා කතාව, බොබ් මාලේගේ රෙගේ ලෝකයේ සැහැල්ලු රස්තා ජීවන ශෛලියේ ප්‍රතිපත්ති වලට නොවෙනස් කළණගේ ජීවිතයේ ප්‍රතිපත්ති වලට අනුව දිග ඇරුණා. කළණ ජීවිතයේ දුෂ්කර කාලවලදී සංගීතය ඇසුරු කිරමින්, සියල්ල හොඳ අතට හැරේවි යන සරල විශ්වාසයෙන් යුතුව ගැටුම් මග හරිමින් ජීවත් වන චරිතයක්.

*නාඳුනන්නාගේ කලුමාලි කතන්දරය:* නාඳුනන මිනිසා යනු නාට්‍යයේ අවසානයේදී දිල් සහ සකීට මුණ ගැහෙන අමුත්තෙක්. නාඳුනන මිනිසාගේ චරිතය, ගෞතම සිද්ධාර්ථ චරිතයෙන් යම් අභාසයක් ලබා නිර්මිත, අධ්‍යාත්මික සොයා යාමේ ගමනක් වෙනුවෙන් තම දරුවා සහ පවුල අත්හැර යන්නට සිතන දෙමාපියෙකුගේ ආත්මීය ඝට්ටනය පිළිබිඹු කරනවා. කවරාකාරයේ උත්තරීතර අරමුණක් උදෙසා පිටව ගියත්, එවැනි තීරණයක් අබිමුව සිටින මවකගේ හෝ පියෙකුගේ අභියෝග ගැන මේ කතාන්දරයෙන් කතා කරනවා.

මේ කතාව පෞරාණික දර්ශනයන් සහ සර්වකාලීන පරිපූර්ණත්වය සමඟ සැරිසරන නිසාත්, සාංදෘෂ්ටිකවාදී ප්‍රශ්න අසන නිසාත්, විශාල සුදු තිරයක් මත සසැලෙන සෙවණැලි ඇසුරින් කිය යුතු යැයි තීරණය වුණා. මේ කලු සුදු සුරංගනා කතාව අනෙක් වර්ණවත් සුරංගනා කතාවලින් පැහැදිලිව වෙනස්ව පෙනුණු අතර අකාලික භාවය සහ ඉරණම පිළිබඳ සංවේදනයක් ජනිත කළා.

මේ කතාන්දරයේදී කලුමාලි දැක ගත හැක්කේ තිරය මත පතිත වන දැවැන්ත සෙවණැල්ලක් ලෙස පමණයි.  සෙවණැල්ලේ විශාලත්වය අඩු වැඩි කරමින් කාලය, ප්‍රමාණය, වැදගත්කම සහ පෞරුෂත්වය  පිළිබිඹු කළා. එසේම ඒ තුළින් කලුමාලිට උරුම වූ දෛවය පිළිබඳ සංවේදනයක් නිර්මාණය කෙරුණා.

දිල් සහ සකී අමුත්තාගේ කලූමාලි කතාවට සවන් දෙති. ගිහාන් ද චිකේරා, ලක්මිණි සෙනෙවිරත්න සහ ශලීනා මුතුමුදලිගේ සමඟ පසුබිමින් ජොනීටා බීලින්
ඡායාරූපය - චානුක තියඹරාවත්ත



## රංගවස්ත්‍ර

රංග වස්ත්‍ර නාට්‍යය කණ්ඩායමේ අයට ලොකු විනෝදයක් ලබා දුන්නා.

සෑම ප්‍රධාන චරිතයක්ම එකම ඇඳුමක් තමයි නාට්‍ය අවසාන වන තුරුම ඇඳ සිටියේ. මෙයට හේතු වුණේ සුරංගනා කතාවල චරිත කිසිවිටෙකත් ඇඳුම් මාරු නොකිරීමයි.

දෙවනුව ප්‍රධාන චරිතයේ ඇඳුම සහ ඔවුන් කියන සුරංගනා කතාව අතර සම්බන්ධයක් තිබුණා. ප්‍රධාන චරිත සියල්ලම ලා පාට දෙකකින් ඇඳුම් ඇන්දා. ඔවුන් කියන සුරංගනා කතාවල චරිත ඒවාට ගැළපෙන පාටවලින් මෝස්තර සහිත ඇදුම් ඇඳ සිටියා. මේ මෝස්තර සුරංගනා කතාවේ ශෛලියට සහ හැඩයට ගැළපෙන ලෙස තෝරාගත්තා.

පසුතල සහායක කණ්ඩායම ප්‍රේක්ෂකයාට නොපෙනෙන ලෙස කලු ඇඳුම් ඇඳීම වෙනුවට නිෂ්පාදනයේ අනිත් චරිතවල සහ පසුතල වලට යොදාගත් වර්ණ සමඟ නොගැටෙන ආකාරයට සාමාන්‍ය ඇඳුම් ඇඳ සිටියා. මේ කණ්ඩායම රංගය පුරාම පසුතල වෙනස් කරමින් නළු නිළියන් සමඟ අන්තර් සම්බන්ධතාවක්  පවත්වාගෙන ගියා.

*කලූමාලිගේ බබාලා හදන මල්ල හිස් නැහැ.*
මල්ෂානි දෙල්ගහපිටිය
ඡායාරූපය - චානුක තියඹරාවත්ත

*කම්මැලි යෝධයින්ට කුඹිච්චි කලුමාලි කොච්චර බෙරිහන් දුන්නත් ඇහෙන්නේ නෑ.*
ජයම්පති ගුරුගේ
ඡායාරූපය - චානුක තියඹරාවත්ත







දිල්ගේ කලූමාලි සහ දිල්. නදී කම්මැල්ලවීර සහ ලක්මිණී සෙනෙවිරත්න. ඡායාරූපය - චානුක තියඹරාවත්ත

## මැජික් අංගරචනා

පළමුවෙනි දර්ශනයේ මැජික් 'විපර්යාසයක්' නිර්මාණය කරා.

පළවෙනි දර්ශනයේදී ෆිල්ම් ආච්චා කලුමාලි මුල් කතාන්දරය කියද්දී ඇගේ දියණියගේ ළමා වියේ සිට ඇගේ මිණිබිරියගේ ළමා විය දක්වා කාල සංක්‍රමණයක් සිදුවෙනවා. එනම් ඇය කතාව මුලින්ම කියන්නට පටන් ගන්නේ දිල් කුඩා දැරියක් කාලයේදී ඇයට. නමුත් ඇය කතාව අවසාන කරන්නේ දශක ගණනාවකට පසුව, ඇගේ මිණිබිරිය වන සකීට යුග යුග ඇදෙන කලුමාලි කතාන්දරය කියමින්. මේ කාල සංක්‍රමණය නිරූපණය කිරීම සඳහා රංගන ශිල්පිනිය ප්‍රේක්ෂාගාරය ඉදිරියේදීම, කාතන්දරය කියන අතර තුර මුහුණ වයස්ගත කරන අංගරචනාවක් කරන්නට සැලැස්වුවා. ඇය තරුණ ෆිල්ම් ආච්චා ලෙස කතාන්දරය කියන්නට ආරම්භ කරනවා. කතාව කියාගෙන යන ගමන් තමන් විසින්ම මුහුණ වයස්ගත කරගන්නවා. කතාව අවසාන වෙන විට ඇය වියපත් ආච්චි අම්මා කෙනෙකු බවට පත්වෙනවා. මේ මගින් ප්‍රේක්ෂාගාරයේ දෑස් ඉදිරිපිටදීම නිළියක් මිනිත්තු කීපයක් ඇතුළතදී තරුණ වියේ සිට මහලු විය දක්වා ගමන් කරන විජ්ජාව මැවුවා.

ජුවනීටා බීලිං තරුණ ෆිල්ම් ආච්චා ලෙස අංගරචනා කරමින්. ඡායාරූපය - පසන් රණවීර

ජුවනීටා බීලිං මහලු ෆිල්ම් ආච්චා ලෙස ඡායාරූපය - චානුක තියඹරාවත්ත







පරිසමාචාරය
ඡායාරූපය - රුවින් ද සිල්වා

**අප අධ්‍යයන ගොනුවේ මේ කොටසින් කලුමාලි නාට්‍යයේ වේදිකාව පිටුපස සිදු වූයේ මොනවාද යන්නත්, ඇගේ මැජික් ලෝකය නිර්මාණය කිරීම සඳහා ඉතා සැලකිල්ලෙන් වේදිකා සැලසුම් නිර්මාණ සකස් කළේ කෙසේද යන්නත් විමසා බැලුවා.**

**දරුවෙක් හදන්න ගමක්ම ඕනෑ බව කියමනක් තියෙනවා. සුරංගනා කතාවක් වේදිකාව මත සජීවී ව දිග හැරීමට  නාට්‍ය ශිල්පීන් කණ්ඩායමක් සෑම ලොකු පුංචි කාරණයක් ගැනම අසීමාන්තිකව වෙහෙසෙමින් දිවා රෑ නොබලා වැඩ කළ යුතු බව අපි අවබෝධ කරගත්තා.**



# කලුමාලි තබා ගිය පා සටහන්

**කලුමාලි නිර්මාණය කළේ ශ්‍රී ලාංකීය වේදිකාව සඳහා. ඇය ඇවිත්, නිශ්චිත බලපෑමක් ඇති කොට, අතුරුදහන්ව ගියා.**

**ඇතැම් ප්‍රේක්ෂකයන් නාට්‍යාවසානයේ කඳුළු පිරුණු දෑස් වලින් වේදිකාව පිටුපසට ආවා. කලුමාලි තුළින් තමන්ගේ ජීවිත වල අරගලය පිළිබිඹු කළ බව ඔවුන්ට තදින්ම දැනී තිබුණා.**

**ඒ වගේම කලුමාලි පෙන්නන්නම බැරි වුණු, එය අතිශයින් විවේචනය කළ ප්‍රේක්ෂකයන්ද සිටියා.**

**මේ කොයි ආකාරයෙන් වුවත්, කලුමාලි ශ්‍රී ලාංකීය  වේදිකාව තුළ කැපී පෙනෙන සටහනක් තැබුවා.**

**අධ්‍යයන ගොනුවේ මේ අවසාන පරිච්ඡේදයෙන් අපි  විමසා බලන්නේ කලුමාලි ලාංකීය වේදිකාවට ගෙන ආවේ මොනවාද, ඇය ඉතිරි කර තබා ගිය සටහන් මොනවාද යන්නයි.**

## *මාතෘත්වය පිළිබඳ අදහස විඛණ්ඩනය කිරීම*
## *පූජනීය භූමියකට අවදානම් ප්‍රවේශයක්*

*කුෂ්චි කලුමාලි තමන්ගේ මෝඩ යෝධයින්ට ආදරෙයි.*
ජයම්පති ගුරුගේ ඡායාරූපය - ශ්‍යාමල් මුතුමුදලිගේ

කලුමාලි වෙත වස්තු විෂය වුණේ මාතෘත්වය සහ දරුවන් හැදීම නමැති, දේශපාලනික, සහ සංස්කෘතිකමය වශයෙන් අතිශයින්ම විවාදසම්පන්න, සංකීර්ණ කාරණයක්. අපේ වැනි සමාජයක, පරිත්‍යාගය, කැපකිරීම, දරාගැනීම, අසීමාන්තික ඉවසීම, ආදී ගුණාංග විසින් අරුත් නංවා ඇති, ගෙදර බුදුන් යැයි කියන, දිව්‍යමය මාතෘත්වය උසුලා සිටින අම්මා ගැන වෙන මානයකින් කතා කරන්නට යෑම අතිශයින් අවදානම් සහගත, එළඹීමක්. ඇත්තටම ලාංකීය වේදිකාවේ මේ කාරණය මේ තරම්ම සෘජුව කතා කළ නිර්මාණයක් මින් පෙර

නොතිබූ බවයි බොහෝ දෙනා කිවුවා. ඒ අතින් අප කළේ, දොර අගුළු ලා, තදින් වසා දමා තිබූ අනුහස් සහිත ඉපැරණි මහේශාක්‍ය ද්වාරයක්, යන්තමින් හෝ විවෘත කර, මාතෘත්වය සහ ඒ හා බැඳුණු සමාජ විනිශ්චයන් පිළිබඳ සංවාදයක් අවුළුවාලීමට උත්සහ දැරීමයි. කලුමාලි, දරුවන් හැදීම සහ තමන් අභිමත ජීවිතය ජීවත් වීම දෙමාපියන්ට මහා ව්‍යාකූල උභතෝකෝටිකයක් බවට පත් කරන අධ්‍යාපන ක්‍රමය, සෞඛ්‍ය සේවය ඇතුළු සමාජ ව්‍යුහයන් සහ ඒවා විසින් අතිශය පෞද්ගලික සීමා සහිත ලෝකයකට දෙමව්පියන් තල්ලු කර දැමීම පිළිබඳව සාකච්ඡා කළා. සමාජ හර පද්ධතීන් සහ සංස්කෘතිය විසින් පෝෂණය කරන ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් අසමානතා පිළිබඳ කතා කළා. ඒ අතින් ගත් කළ ලංකාවේ වේදිකා නාට්‍ය අතුරින්, වචනවලට නොනගන ලද සත්‍යයන් සැඟවී ඇති මෘතෘත්වයේ පූජනීය භූමියට ඇතුළුවීමට අවදානමක් ගත් පළවෙනි නිර්මාණය කලුමාලි විය හැකියි.

## *එක නාට්‍යයක්, එක කණ්ඩායමක්, භාෂා දෙකක්*
## *ද්විභාෂිකත්වය ආරක්ෂා කිරීම*

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම එහි ආරම්භයේ පටන්ම ලංකාවේ ඉංග්‍රීසි සහ සිංහල වේදිකාවේ ශිල්පීන් සහ ප්‍රේක්ෂකාගාරය අතර පාලමක් ඉදිකරමින් සිටිනවා.

කලුමාලි නාට්‍යය, සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකේම එකතුවක් විය යුතුය යන්න මුල සිටම එළඹ සිටි තීරණයක්. එකම නාට්‍යය තුළ භාෂා දෙකම පාවිච්චි කිරීම අසාර්ථක බව වැටහුණු තැන, වෙන වෙනම නිෂ්පාදන දෙකක් කරා අප ගමන් කළා. ද්විභාෂිකත්වය යනු Passing Stage අත්පිටපතේ සිට කලුමාලි නාට්‍යය දක්වා ආ ගමනේදී ඉතා ඉහළින් ආරක්ෂා කළ, විශාල වටිනාකමක් දුන් අංගයක්. Passing Stage අත්පිටපතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකින්ම රචනා තිබුණා. Cast As Mother කියවීමත් භාෂා දෙකම මිශ්‍රිත වූ ඉදිරිපත් කිරීමක්.

එකම නාට්‍යය සිංහල සහ ඉංග්‍රීසි නිෂ්පාදන දෙකක් ලෙස එක පෙළට ඉදිරිපත් කිරීමත් ලාංකීය වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට අලුත්ම අත්දැකීමක්. සාමාන්‍යයෙන් මෙය කිරීම සඳහා සම්පත් නොමැති කමයි බොහෝ විට නාට්‍ය කරුවන්ට අභියෝගය වන්නේ. ස්ටේජස් නාට්‍ය කණ්ඩායම ඒ අතින් අතිශයින් පොහොසත්. සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකින්ම වැඩ කිරීමේ හැකියාවක් ඔවුන්ට තියෙනවා. ඔවුන්ගේ කණ්ඩායම ඉංග්‍රීසි සහ සිංහල වේදිකාවෙන් ආ ශිල්පීන්ගෙන් සමන්විත මිශ්‍රිත කණ්ඩායමක්.

කලුමාලි යනු ලංකාවේ ඉංග්‍රීසි සහ සිංහල නාට්‍ය ප්‍රේක්ෂකාගාර දෙකම එක ලෙස නැරඹූ නිෂ්පාදනයක්. මේ මූලාශ්‍ර දෙකේම කලාකරුවෝ එකට එකතු වී කළ වැඩක්.

එය ලාංකීය වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ සුවිශේෂී මොහොතක්. එකිනෙකාගෙන් දුරස්ථව සිටි කලාකරුවන් දෙපිරිසක් සහ ප්‍රේක්ෂකාගාර දෙකක් එක් කළ අවස්ථාවක්. කලුමාලි පුරෝගාමීත්වය දුන් මේ එළඹුම, පසුව අනෙක් නාට්‍ය කණ්ඩායම් විසින්ද යම් යම් මට්ටමින් අනුගමනය කරන්නට පටන් ගත්තා. සිංහල සහ ඉංග්‍රීසි වේදිකා නාට්‍ය අධ්‍යක්ෂවරුන්, තමන්ගේ නිර්මාණ වලට ශිල්පීන් තෝරාගැනීමේදී පෙර නොදැන සිටි දක්ෂ කලාකරුවන් නියැදියකින් තේරාගැනීම් කිරීම ඇරඹුවා. භාෂාමය, සංස්කෘතිකමය සහ සමාජ පන්තිමය වශයෙන් ගතානුගතිකව ගොඩ නැගී තිබූ දුරස්ථ බව ලිහී යමින් ලංකාවේ සිංහල සහ ඉංග්‍රීසි වේදිකාව සමීප සගයන් බවට පත් වීමේ නැඹුරුතාවක් ඇරඹුණා.

පසුකලෙක නාට්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ අයිතීන් දිනාගැනීමේ ජාතික සටන් වලදී මේ දෙපිරිසම එකාවන්ව පෙළ ගැසුණා.

මෙය ලංකාවේ නාට්‍ය කලා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කලුමාලි වෙතින් ලැබුණු අතිශයින්ම සුබවාදී, ප්‍රගතිශීලි දායකත්වයක්.

**අවාසනාවකට මෙන්, මෙම කාලයේ දී දමිළ නාට්‍ය කලාව 30 වසරක සිවිල් යුද්ධයෙන් අතිශය පීඩාවට පත්ව තිබුණා.**

## ඩිවයිසින් විධිමත් ක්‍රමවේදයක් ලෙස පිළිගැනීමට ලක්වීම

කලුමාලි නාට්‍යය අද ලංකාවේ නාට්‍ය ක්ෂේත්‍රය තුළ හඳුනාගන්නේ ඩිවයිසින් තුළින් ලංකාවේ නිර්මාණය කළ ප්‍රධානතම ජාතික මට්ටමේ නාට්‍යයක් හැටියට.

කලුමාලි නිර්මාණය කරන විට, බොහෝ අය ඩිවයිසින් ගැන දැනගෙන සිටියේ නැහැ. රුවන්ති ද චිකේරා නාට්‍යවේදිනිය විසින් ඩිවයිසින් ක්‍රමවේදය පාවිච්චි කරමින් දිගින් දිගටම නොයෙක් අත්හදාබැලීම් කරමින් සිටියා. කලුමාලි නාට්‍යයෙන් පසුව නාට්‍ය නිර්මාණ ක්‍රමවේදයක් ලෙස ඩිවයිසින් ක්‍රමය ලංකාවේ නාට්‍ය ක්ෂේත්‍රය තුළ වැඩි පිළිගැනීමකට ලක් වුණා.

මීට පෙර, මේ ක්‍රමයේ ආභාසය ලබා නිර්මාණය කළ නිර්මාණ තිබුණු බව අප දන්නවා. උදාරණයක් විදියට සෝමලතා සුබසිංහ මහත්මිය 1981 තරම් ඈත කාලයේ නිර්මාණය කළ විකෘති නාට්‍යය මේ ඩිවයිසින් ක්‍රමයේ ඇතැම් එළඹුම් යොදාගෙන නිර්මාණය කර තිබෙනවා. Mind Adventures නාට්‍ය කණ්ඩායම ඇතුළු තවත් නාට්‍ය කණ්ඩායම් ගණනාවක් මේ ක්‍රමය ඇසුරින් විවිධ අත්හදා බැලීම් කර තිබෙනවා. කෙසේ වෙතත් ඩිවයිසින් ක්‍රමය, ශිල්පීන් වෘන්දයක් සමඟ  නාට්‍ය නිර්මාණය කිරීමේ විධිමත් ක්‍රමවේදයක් හැටියට මුලින්ම ශක්තිමත්ව පැළපදියම් වුණේ කලුමාලි නාට්‍යයෙන් පසුව.

## සෙවණැලි රංගය (Shadow Theatre)

කලුමාලි නාට්‍යයේ නාට්‍යමය ඉදිරිපත් කිරීම තුළ සුවිශේෂී අංග ගණනාවක්ම තිබුණා. ඒවා ඉන් පෙර ලංකාවේ වේදිකා නාට්‍ය නිර්මාණ තුළ එතරම් භාවිත වී තිබුණේ නැහැ.

සෙවණැලි රංගය මේවැන්නක්. කලුමාලි හි අවසාන ජවනිකාව සම්පූර්ණයෙන්ම නිර්මාණය කර තිබුණේ සෙවණැලි රංගය තුළින්. මෙය ඇත්තෙන්ම වේදිකා පසුතල නිර්මාපකයන්ටත් නළු නිළියන්ටත් විශාල අභියෝගයක් වුණා. එසේම විශාල ඉගැනුම් අත්දැකීමකුත් වුණා. සිංහල සහ ඉංග්‍රීසි ප්‍රේක්ෂකාගාර දෙකටම එය මින් පෙර වේදිකාවේ දැක නොතිබුණු නවතම අත්දැකීමක් වුණා.

කෙසේ වෙතත් සෙවණැලි රංගය පාවිච්චි කිරීම නිසා ඇතැම් ප්‍රායෝගික ගැටළුත් පැන නැගුණා. විශේෂයෙන්ම ලංකාවේ කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහල හැරුණු කොට දවල් කාලයට සම්පූර්ණයෙන්ම අඳුරු කළ හැකි ශාලාවල් ඇත්තේම නැති තරම්. මේ නිසා කලුමාලි වෙනත් නාට්‍ය ශාලාවක උදෑසන හෝ දහවල දර්ශනයක් පෙන්වීමේ හැකියාවක් තිබුණේ නැහැ. මෙය කලුමාලි නාට්‍යය කොළඹින් පිට වේදිකාගත කරන්නට තිබූ ප්‍රධානම බාධකයක්.

* * *



කලුමාලිගේ පවුලේ බැඳීම් විසින් ඇයව නතර කිරීමට උත්සහ
කරයි. ජුවනීටා බීලිං සහ වේදිකා සහයකයින්.
ඡායාරූපය - චානුක තියඹරාවත්ත

අපි දැන් අපේ අධ්‍යයන ගොනුවේ අවසානයට ඇවිත් තියෙන්නේ. මීට දශකයකට කලින් අපි කලුමාලි ලෝකයට මුදා හැර, මිනිසුන් ඇයට ආදරය කරන හැටි, වෛර කරන හැටි, ඇයව අමතක කර දමන හැටි සහ කිසිදා අමතක නොකළ හැටි බලාගෙන සිටියාක් මෙන්, කොයියම්ම ආකාරයකින් හෝ මෙය ප්‍රයෝජනවත් වේවි යන නිස්සරණාධ්‍යාශයෙන් මේ අධ්‍යයන ගොනුවත් ඔබ වෙත පවරා දෙන්නෙමු.

අපි අවසාන වශයෙන් කියන්නේ, ඔබට කිසියම්ම ආකාරයකට හෝ කලුමාලි ඇසුරු කරන්නට අවස්ථාව තිබුණා නම්, ඔබ ඔබේම ජීවිතයේ ඒ මැජික් සුරංගනා කතාව ගැන නිරන්තරයෙන්ම විමසිල්ලෙන් සිටිය යුතු බවයි. කවදා හෝ එය ඔබ අතින් ලියවෙන්නට ඉඩ ඇති බැවිනි.

එය කුමනාකාරයේ කතාන්දරයක් වේවිද?

ඔබට ඒ කතාව ඔබේ දරුවන්ට කියන්නට ඕනෑ වේවිද?

© ස්ටේජස් තියටර් ගැරන්ටි ලිමිටඩ්, 2020

මෙම අධ්‍යයන ගොනුව ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ ‘Artist Research - Archiving and Documentation’ නම් ව්‍යාපෘතියේ කොටසක් ලෙස සම්පාදනය වූවකි.

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම වසර දහයක් පුරාවට කළ නිෂ්පාදන ක්‍රියාවලීන් විශ්ලේෂණය හරහා කලා භාවිතයේ නියුතු කලා ශිල්පීන් ඔවුන්ගේම නිර්මාණයන් ක්‍රමවත් හා විචාරාත්මක විශ්ලේෂණයට භාජනය කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදුවිය. මේ දශකය නම් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය නිම වූ වසරේ සිට එළැඹි දස වසරයි (2009 සිට 2019 දක්වා).

ප්‍රකාශනයට පත්කිරීමේ අටියෙන් මෙවැනි අධ්‍යයන ගොනු දාසයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් නිම විය. කලා ශිල්පීන් විසින් පර්යේෂණකොට රචනා කරන ලද මේ සෑම අධ්‍යයන ගොනුවක්ම මෙම නිෂ්පාදන බිහි වූ සමාජ-දේශපාලනික සන්දර්භ වටපිටාවන් විභාග කරන අතර එම ක්‍රියාවලීන් තුළදී කරනා ලද නිර්මාණාත්මක තීරණ විශ්ලේෂණය කරයි. මේ ප්‍රයත්නයේම අංගයක් ලෙස ඊට සමගාමී වීඩියෝපට මාලාවක්ද නිර්මාණය කරන ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය හරහා නිෂ්පාදනය කරන ලද සියලුම සම්පත් www.stages.lk වෙබ් අඩවිය හරහා ඔබට ලබාගත හැක.

# අධ්‍යයන ගොනු

**සංස්කරණය (ලිඛිත):** රුවන්ති ද චිකේරා

**සංස්කරණය (වීඩියෝ):** මලිත් සුලාර

**භාෂා සංස්කරණය:** නිපුනි ශාරදා පතිරගේ (සිං), කිං රත්නම් (දෙ)

**රචනය:** රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, ජයම්පති ගුරුගේ, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, පියුමි විජේසුන්දර, නලින් ලුසේනා

**පිටු සැලසුම්:** මල්ෂානි දෙල්ගහපිටිය, රජිත පවිත්‍ර මධුභාෂ

**සෝදුපත් බැලීම සහ භාෂා සංස්කරණය:** ආශා අබේකෝන්, ගිහාන් ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, යූ.ඩී.ආර්.එච්.කේ.ගුණසිංහ, ට්‍රෙසි හොල්සින්ගර්, අරවින්ද ජයසේකර, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, සුදේශ්නා රන්මුතුගල, කිං රත්නම්, තිලකා සුභසිංහ.

**සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ:** ප්‍රසාද් අලුත්වත්ත, ඬේවිඩ් කොටරල්, සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ, වෙනුර නවෝද්, දෙශාන් තෙන්නකෝන්

**සැලසුම් සහය:** කියාස් අහමඩ්, මල්ෂානි දෙල්ගහපිටිය, ජනිත් හර්ශන.

**පර්යේෂණ සහය:** කෞශල්‍යා ආටිගල, නලින් ලුසේනා, රජිත පවිත්‍ර මධුභාෂ, අකලංක ප්‍රභාශ්වර, දිනුෂිකා සෙනෙවිරත්න

**පරිවර්තනය:** හිරණ්‍යදා දේවසිරි (සිං/ඉං), අරුන්දි ජයසේකර (සිං/ඉං), මනුලි ලවන්‍යා (සිං/ඉං), ලිහිණි නිලවීර (සිං/ඉං), ජිනාදනී පරමේශ්වරම් (දෙ), ශාමලා වේදනායගම් (දෙ), පියුමි විජේසුන්දර (ඉං), හිමංසි දෙහිගම (සි)

**කැමරාකරණය:** වෙනුර නවෝද්, කිං රත්නම්, ප්‍රමිල සමරකෝන්, කසුන් උක්වත්ත

**වෙබ් අඩවි නිර්මාණය:** රන්සක ගල්මන්ගොඩ

**කළමනාකරණය:** මල්ෂානි දෙල්ගහපිටිය, මහේෂ් ලක්මාල්

**ස්ටේජස් නාට්‍ය කණ්ඩායම**
**අධ්‍යයන ගොනු**

**DCS දශක හතක ශ්‍රී ලංකාව**
රචනය : රුවන්ති දි චිකේරා, නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS Girls at Checkpoints**
රචනය : පියුමි විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS ස්වයංකථන**
රචනය : රුවන්ති ද චිකේරා
සහය: පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**DCS රුවන්ඩා - ශ්‍රී ලංකා සහයෝගීත්ව නිර්මාණය**
රචනය : නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ග්‍රීස් යකා**
රචනය: රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**කලුමාලි : වැඩිහිටියන්ට සුරංගනා කතාවක්**
රචනය: රුවන්ති දි චිකේරා, නදී කම්මැල්ලවීර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**Love and Other Objects**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**Ovaryacting !**
රචනය : පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**Passing Stage ව්‍යාපෘතිය**
රචනය: රුවන්ති ද චිකේරා
සහය: කෞෂල්‍යා ආටිගල, රජිත පවිත්‍ර මධුභාෂ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ

**සිරියානු ස්වයංකථන**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**The Certificate**
රචනය: රුවන්ති ද චිකේරා
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: සංජය එක්නැළිගොඩ

**Thought Curfew**
රචනය: පියුමි විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ඩේවිඩ් කොටරල්

**Walking Path - වචන නැති නාට්‍යයක්**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් කලා ශිල්පී පුහුණු වැඩමුළුව**
රචනය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**Stages Junior Ensemble**
රචනය: පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව**
රචනය: ජයම්පති ගුරුගේ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

stages
theatre
group